# (ඒ) විදේශීය වෙළෙඳාම

## (අ) සමස්ථ උපනතීන්:

ගතවූ වර්ෂය හා සසඳා බලන විට, 1970 වර්ෂයේදී දේශීය මුළු අපනයන ඉපැයීම්වල සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, එය 1968 වර්ෂයට පසු වාර්තාගත ඉහළම මට්ටම විය. අපනයන ඉපැයීම් ඉහළ යාමට බොහෝ දුරට හේතු වූයේ තේ, රබර් හා දේශීය සෙසු නිෂ්පාදිතයන්ගේ අපනයන පරිමාවන්හිවූ ප්‍රසාරණයයි. එහි බලපෑම තේ හා ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි අපනයනමිල ඉහළ යාම විසින් වඩාත් ශක්තිමත් කරනු ලැබිණි.

1970 වර්ෂයේ ප්‍රති අපනයන ඇතුළු අපනයනයන්ගේ වටිනාකම රුපියල් දශලක්ෂ 2,033 ක්වූ අතර, ආනයනයන්ගේ වටිනාකම රුපියල් දශලක්ෂ .2,313[1] ක් වීමෙන් භාණ්ඩ වෙළෙඳාමෙන්වූ හිඟය රුපියල් දශලක්ෂ 280 ක් විය.

1968 වර්ෂය හැරුනු විට, අපනයනයන්ගේ රුපියල් වටිනාකම සැළකිය යුතු ලෙස ඉහළ ගියද, 1966 වර්ෂයේ සිට අපනයන ඉපැයීම්වල පහළ වැටීමේ උපනතියක් දිස් වූයේය, කෙසේ වුවද, එ. ජ. ඩොලර් වටිනාකමින්, 1966 දී ආරම්භවූ එකී උපනතිය 1968 වර්ෂයත් ඇතුළුව නොකඩවා පැවතිණි. 1970 දී ලංකාවේ අපනයන වටිනාකම, 1969 ලේඛනගතවූ වටිනාකමට වඩා රුපියල් දශලක්ෂ 117 කින් වැඩිවිය. 1970 දී අපනයන ඉපැයීම්වල ඩොලර් සමකය එ. ජ. ඩොලර් දශලක්ෂ 342 ක්වූ අතර. එය ගතවූ වර්ෂයට වඩා එ. ජ. ඩොලර් දශලක්ෂ 20 කින් ඉහළ යාමකි.

1968 දී ඉහළ යාමට පටන් ගත් ආනයන වටිනාකම, 1969 දී උපරිම මට්ටමකට ළඟාවූ අතර, රුපියල් දශලක්ෂ 370 කින් හෙවත් සියයට 17 කින් 1968 මට්ටම ඉක්මවූයේය. කෙසේ වෙතත්, ආනයන වටිනාකම්හි ඉහළ යන උපනතිය 1970 දී ආපස්සට හැරීමෙන් වර්ෂයේ ආනයනයන්ගේ මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 2,313 ක් දක්වා, එනම් රුපියල් දශලක්ෂ 230 කින් හෙවත් සියයට 9 කින් පහළ වැටිණි.

වාර්තාගත ඉහළම මට්ටමවූ 1969 වර්ෂයේ රුපියල් දශලක්ෂ 627 ක හිඟය හා සසඳන කල 1970 අවසානයේදී ශුද්ධ වෙළෙඳ තත්ත්වය, රුපියල් දශලක්ෂ 280 ක භාණ්ඩ වෙළෙඳ හිඟයකි. ඉකුත් වර්ෂය හා සසඳා බලන විට අපනයන ඉපැයුම්වල සැළකිය යුතු ඉහළ යාමත්, ආනයන වටිනාකම් තියුණු ලෙස පහළ වැටීමත් 1970 දී අවාසිදයක වෙළඳ පරතරය අඩුවීමට හේතු විය.

වර්ෂයේ මුළු අපනයන වටිනාකම්වල ප්‍රතිශතයක් ලෙස දක්වන කල 1970 භාණ්ඩ වෙළෙඳ හිඟය සියයට 14 කි. 1969 දී එය සියයට 33 ක් හා 1968 දී එය සියයට 7 ක් විය. වෙළෙඳ හිඟය පියවීම සඳහා දේශීය අපනයන ඉපැයුම් නොවන වෙනත් මූලයන් කෙරෙහි විශ්වාසය තැබීමට රටට සිදුවිය[2]. 1970 ආනයන සංයුතියෙහි, ''අන්තර් භාණ්ඩ'' හා ''ආයෝජන භාණ්ඩ'' ආනයනය පහළ බැස ඇති අතර, ''පාරිභෝගික භාණ්ඩ'' ආනයනය ඉහළ නැග ඇත. 1970 පාරිභෝගික භාණ්ඩ, වටිනාකම් වශයෙන් ඉකුත්වූ වර්ෂයට වඩා සියයට 6 කින් ඉහළ ගොස් තිබේ. ''පාරිභෝගික භාණ්ඩ'' තුළ ''වෙනත් පාරිභෝගික භාණ්ඩයන්ගේ'' කොටස පහත වැටී ඇති අතර, ප්‍රධාන වශයෙන් සහල්, පිටි හා සීනි[3]

---

1· මුළු ආනයන පිළිබඳ සංඛ්‍යා ප්‍රවේශමෙන් විවරණය කළ යුතුය. ඉකුත්වූ වාර්ෂික වාර්තාවල දක්වූ පරිදි ආනයන කළ භාණ්ඩ රේගුවෙන් ඉවත් කිරීමත්, අදළ රේගු සටහන් ලේඛනගත වීමත් අතර සැළකිය යුතු කාල පරතරයක් ඇතිවූනි නම්, කිසියම් කාල පරිච්ඡේදයක් තුළ නියත වශයෙන් ලැබී, රේගුවෙන් ඉවත් කර ගන්නා ලද ආනයනයන්ගේ වටිනාකමත්. රේගු වාර්තාවලින් පිළිබිඹු වන පරිදි ඒවායේ වටිනාකමත් අතර සැළකිය යුතු වෙනසක් ඇතිවිය හැකිය. මෙය විශේෂයෙන්ම අදාළ වන්නේ රජයේ ආනයනයන්ට හා සහල්, පිටි සහ සීනි ආනයනයන්ටය.

2· විවිධ භාණ්ඩ ආධාර වැඩ සටහන් යටතේ 1970 දී ලැබුණු විදේශීය ආධාර රුපියල් දශලක්ෂ 315·6 ක් වෙයි.

3· මෙම චලනයන්ගේ විස්තර 234 පිටුවේ හා 235 පිටුවේ දක්වේ

ආනයනයන් වැඩිවීම නිසා ''ආහාර හා බීම'' වර්ගයන්ගේ කොටස ඉහළ ගොස් තිබේ. ''අන්තර් භාණ්ඩ'' සහ ආයෝජන භාණ්ඩයන්ගේ වටිනාකම පිළිවෙළින් සියයට 24 කින් හා සියයට 22 කින් පහළ වැටී ඇත.

1969 දී සියයට 5 කින් පහළ වැටුණු සියලු අපනයනයන්ගේ මුළු පරිමාව, (1967=100 ලෙස සළකා ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයෙන් මනින කල) 1970 දී 102 දක්වා සියයට 4 කින් ඉහළ ගියේය. 1969 දී නොවෙනස්ව පැවතුණු, සමස්ථ අපනයනයන්ගේ සාමාන්‍ය මිල දර්ශකය; විමර්ශණයට භාජනය වන වර්ෂයේදී 118 දක්වා ආන්තික වශයෙන් සියයට 1 කින් වැඩිවී ඇත.

II (ඒ) 1 වැනි සංඛ්‍යා සටහනෙන්, රේගු සංඛ්‍යා මත පදනම වී ඇති ලංකාවේ විදේශීය වෙළෙඳාම පිළිබඳ තොරතුරු සපයයි.

### II (ඒ) 1 වැනි සංඛ්‍යා සටහන

### විදේශීය වෙළෙඳාම 1966 - 1970

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශකාංක (1967 = 100)[1] | | | | වෙළෙඳ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිල | | |
| | අපනයන* නැ.වි.ස. | ආනයන මි.ර ගැ. | වෙළෙඳ ශේෂය | මුළු අපනයන | මුළු ආනයන | මුළු අපනයන | මුළු ආනයන | |
| 1966 .. | 1,700 | 2,028 | – 328 | 96 | 118 | 107 | 98 | 109 |
| 1967 .. | 1,690 | 1,738 | – 48 | 100 | 100 | 100 | 100 | 100 |
| 1968 .. | 2,035 | 2,173 | – 138 | 103 | 101 | 117 | 126 | 93 |
| 1969 .. | 1,916 | 2,543 | – 627 | 98 | 108 | 117 | 134 | 88 |
| 1970 .. | 2,033 | 2,313 | – 280 | 102 | 103 | 118 | 140 | 84 |

මූලයන්: ලංකා රේගු වාර්තා.
ශ්‍රී ලංකා මහ බැංකුව.

* ප්‍රති අපනයනයන් ඇතුළත්වයි.
(1) සංශෝධිත දර්ශක.

සියළු ආනයනයන්ගේ මුළු පරිමාව (1967 = 100 ලෙස සළකා ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයෙන් මනින කල) 1969 දී සියයට 7 කින් වැඩිවූ අතර 1970 දී 102 දක්වා සියයට 6 කින් පහළ වැටුණේය. ප්‍රධාන ආනයන ගණයන්ගේ පරිමා දර්ශකයනට අනුව ''අන්තර් භාණ්ඩ'' 86 හා ''ආයෝජන භාණ්ඩ'' 116 ක්වූ දර්ශකයන් පිළිවෙලින් සියයට 17 ක හා සියයට .33 ක පහළ වැටීමක් පෙන්නුම් කරන අතර, 106 ක්වූ ''පාරිභෝගික භාණ්ඩ'' දර්ශකය සියයට 14 ක ඉහලයාමක් පෙන්නුම් කරයි.

1970 දී සියලු ආනයනයන්ගේ සාමාන්‍ය මිල දිගටම වැඩිවීමේ උපනතිය පැවතුණ අතර 140 ක්වූ මිල දර්ශකය 1969 දීට වඩා සියයට 4 කින් ඉහළ යාමක් පෙන්නුම් කළේය. ''අන්තර් භාණ්ඩ'' සහ ආයෝජන භාණ්ඩ වල සාමාන්‍ය මිල දර්ශකය 1970 දී පිළිවෙලින් සියයට 9 හා සියයට 17 බැගින් 136 සහ 148 දක්වා වැඩිවූ අනර, 139 ක්වූ ''පාරිභෝගික භාණ්ඩ'' මිල දර්ශකය සියයට 1 ක සුළු ප්‍රමාණයකින් අඩු විය.

පසුගිය වර්ෂ දෙකේදී පිරිහීමක් පෙන්වන ලද ලංකාවේ භාණ්ඩ වෙළඳ අනුපාතය (බැංකුවේ දර්ශක පාදය 1967 = 100) 1969 දී 88 මට්ටමේ සිට 1970 දී 86 දක්වා තවදුරටත් පහළ වැටුණි.

සහල්, පිටි හා සීනි ආනයනයන් පිළිබඳ රේගු සංඛ්‍යා ආහාර කොමසාරිස් විසින් තථ්‍ය වශයෙන් ආනයන කළ යථෝක්ත භාණ්ඩයන්ගේ වටිනාකමට වඩා රුපියල් දශලක්ෂ 44 කින් අධි දක්වීමක් පෙන්නුම් කරන අතර, 1970 දී එකී ආනයනයන් පිළිබඳ රේගු සංඛ්‍යා, රුපියල් දශලක්ෂ 18 කින්, ආහාර කොමසාරිස්ගේ සංඛ්‍යා අධි දක්වීමක් කරනු ලබයි.

1969 හා 1970 සඳහාවූ මුළු ආනයන (රේගු සංඛ්‍යා) ආහාර කොමසාරිස් විසින් තථ්‍ය වශයෙන් ලබා ඇති සහල් පිටි හා සීනි ආනයනයන් පිළිබිඹු වන අයුරු ගැළවූ විට මුළු ආනයන වටිනාකම 1969 දී හා 1970 දී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 2543 හා රුපියල් දශලක්ෂ 2313 සිට රුපියල් දශලක්ෂ 2499 හා රුපියල් දශලක්ෂ 2295 දක්වා අඩුවේ. මෙසේ ගලපන ලද ආනයන සංඛ්‍යා පදනම මත, 1970 ආනයන වටිනාකම ඉකුත්වූ වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 204 කින් හෙවත් සියයට 8 කින් ඌනතාවක් දක්වයි.

ආහාර කොමසාරිස්ගේ තථ්‍ය ආනයනයන්ට ගලපන ලද දත්ත පදනම මත, 1969 භාණ්ඩ වෙළෙඳ හිඟය රුපියල් දශලක්ෂ 627 සිට රුපියල් දශලක්ෂ 583 දක්වාත්, 1970 රුපියල් දශලක්ෂ 280 සිට රුපියල් දශලක්ෂ 262 දක්වාත් අඩුවනවා ඇත.

**(ආ) අපනයන**

1970 අපනයන ඉපැයුම් රුපියල් දශලක්ෂ 117 ක ඉහළ යාමට බොහෝදුරට හේතු වූයේ තේ හා දේශීය සෙසු අපනයනයන්ගේ අපනයන ඉපැයුම් ඉහළයාමයි. රබර් හා ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි අපනයන ලැබීම්ද සුළු වශයෙන් ඉහළයාමක් සලකුනු කරනු ලැබුවත්, ප්‍රතිඅපනයන යන්ගෙන්වූ ඉපැයුම් සුළු වශයෙන් පහත වැටීමක් දක්වනු ලැබේ. අපනයන සංයුතිය සහ මුළුඅපනයන ඉපැයුම්හි ඒවාහි ප්‍රතිශතක කොටස් II (ඒ) 2 සංඛ්‍යා සටහනෙන් අනාවරණය වෙයි.

**II (ඒ) 2 වැනි සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය 1966 - 1970**

| ද්‍රව්‍යය | වටිනාකම රුපියල් දශ ලක්ෂ වලින් | | | | | මුළු අපනයනයන්ගේ ප්‍රතිශතකය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1966 | 1967 | 1968 | 1969 | 1970 | 1966 | 1967 | 1968 | 1969 | 1970 |
| තේ .. .. | 1027 | 1061 | 1162 | 1062 | 1120 | 60 | 63 | 57 | 55 | 55 |
| රබර් .. .. | 337 | 282 | 331 | 431 | 440 | 20 | 17 | 16 | 22 | 22 |
| ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන . | 196 | 167 | 331 | 221 | 237 | 12 | 10 | 16 | 12 | 12 |
| ඒවා බෙදී ගිය අයුරු | | | | | | | | | | |
| (අ) කොප්පරා .. | 25 | 18 | 34 | 26 | 23 | 2 | 1 | 2 | 1 | 1 |
| (ආ) පොල් තෙල් .. | 108 | 88 | 133 | 108 | 116 | 6 | 5 | 7 | 6 | 6 |
| (ඇ) කපාපු පොල් .. | 63 | 61 | 164 | 87 | 98 | 4 | 4 | 8 | 5 | 5 |
| දේශීය සෙසු අපනයන .. | 116 | 121 | 152 | 161 | 198 | 7 | 7 | 8 | 8 | 10 |
| දේශීය මුළු අපනයන .. | 1676 | 1631 | 1976* | 1875 | 1995 | 99 | 97 | 97 | 98 | 98 |
| ප්‍රති අපනයන .. .. | 24 | 59 | 60 | 41 | 38 | 1 | 3 | 3 | 2 | 2 |
| එකතුව .. | 1700 | 1690 | 2035 | 1916 | 2033 | 100 | 100 | 100 | 100 | 100 |

මූලය: ලංකා රේගු වාර්තා.

* අපනයන ඉපයීම් සංඛ්‍යා ආසන්න දශලක්ෂයට ගණන් බලා ඇත.

**තේ නිෂ්පාදනය**

1970 තේ නිෂ්පාදිතය වූ රාත්තල් දශලක්ෂ 468, 1969 නිමැවුමට වඩා රාත්තල් දශලක්ෂ 16 කින් අඩුවී ඇති අතර, 1962 න් පසු ලේඛනගත පහළම මට්ටම එය වෙයි. 1968 හා සසඳන කල, 1970 නිෂ්පාදිතය රාත්තල් දශලක්ෂ 28 කින් අඩුවී ඇත. නිෂ්පාදිතයේ පහළ වැටීමට; 1969 පසු භාගයේදී වගාවන් සඳහා පොහොර වර්ග යෙදීම අඩුවීමෙන්වූ "ප්‍රමාද", ප්‍රතිවිපාක, අයහපත් කාලගුණය, විශේෂයෙන් වර්ෂයේ පළමුවන හා තෙවෙන කාර්තුවල පැවති තද වර්ෂාව සහ දෙවන කාර්තුවෙහිදී හොඳ දළු නෝරා නෙලීම, ඉහළ මට්ටමේ නිෂ්පාදනය ආදී හේතූන් තුඩු දී ඇත. II (ඒ) 3 සංඛ්‍යා සටහනෙහි දක්වෙන පරිදි, පහත් බිම් වගා නිමැවුම ඉහළ ගොස් ඇතත්, උස් හා මැදි බිම් වගා නිමැවුම් පහළ වැටී තිබේ.

## II (ඒ) 3 වැනි සංඛ්‍යා සටහන

### භූමි පිහිටීම් අනුව තේ නිෂ්පාදිතය හා මුළු නිෂ්පාදිතය තුළ ඒවායේ ප්‍රතිශත කොටස්.

(රාත්තල් දශ ලක්ෂ)

| භූමි පිහිටීම | 1969 | | 1970 | | 1969ට වඩා 1970 වූ නිරපේක්ෂ වෙනස |
|---|---|---|---|---|---|
| | පරිමාව | % | පරිමාව | % | |
| උස්බිම් වගාව .. | 187·2 | 38·7 | 178·8 | 38·2 | — 8·4 |
| මැදබිම් වගාව .. | 170·9 | 35·3 | 159·2 | 34·0 | — 11·7 |
| පහත්බිම් වගාව .. | 126·1 | 26·0 | 129·8 | 27·8 | + 3·7 |
| එකතුව .. | 484·2 | 100 0 | 467·8 | 100·0 | — 16·4 |

මූලය: තේ පාලන දෙපාර්තමේන්තුව

**අපනයන**

1970 රාත්තල් දශලක්ෂ 460 ක්වූ තේ අපනයන පරිමාව, 1969 ට වඩා රාත්තල් දශලක්ෂ 15 කින් ඉහළ ගොස් ඇත. 1969 දෙසැම්බර් මාසයේදී අපනයන කළ තේ පරිමාව කෙරෙහි කොළඹ හා ත්‍රිකුණාමලයේ වරායවලවූ වැඩ වර්ජන බලපා ඇති අතර, එකී ප්‍රමාදයන් 1970 අපනයන කළ ප්‍රමාණයන්ටද බලපාන්නට ඇත. නිෂ්පාදිතය පහළ වැටීමක් සිදුවෙද්දී, අපනයන පරිමාව ප්‍රසාරණය වූයේ තේ තොග අඩු කිරීමක් නිසා වන්නට පුළුවන. දැනට ලබාගතහැකි සංඛ්‍යා අනුව, 1969 දෙසැම්බර් මාසය අවසානයේ රාත්තල් දශලක්ෂ 87 සිට 1970 නොවැම්බර් මාසය අවසාන වන විට රාත්තල් දශලක්ෂ 45 ක් දක්වා ලංකාවේ නිෂ්පාදනය කරන ලද තේ තොග පහළ වැටීමක් පෙන්නුම් කරයි.[1]

1970 දී කොළඹ වෙන්දේසියට ඉදිරිපත් කරනු ලැබූ තේ ප්‍රමාණයන් රාත්තල් දශලක්ෂ 373 දක්වා රාත්තල් දශලක්ෂ 14 කින් පහත වැටී ඇති අතර, කෙලින්ම ලන්ඩන් වෙන්දේසියට නැව්ගත කරන ලද ප්‍රමාණයන් රාත්තල් දශලක්ෂ 91 දක්වා, රාත්තල් දශලක්ෂ 3 කින් ඉහළ ගොස් ඇත. පෞද්ගලික අලෙවිය මගින් රාත්තල් දශලක්ෂ 4 ක් විකුණන ලදී. 1969 එකී ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 5 ක් විය. තේ නිෂ්පාදිතය, අපනයන, කොළඹ වෙන්දේසියට ඉදිරිපත්වූ ප්‍රමාණයන් හා ලන්ඩන් වෙන්දේසියට කෙලින්ම නැව්ගත කළ පරිමාවන් මෙන්ම පෞද්ගලික ගිවිසුම් මගින් අලෙවිවූ පරිමාවන් II (ඒ) 4 සංඛ්‍යා සටහනෙන් සපයයි.

## II (ඒ) 4 වැනි සංඛ්‍යා සටහන

### නිෂ්පාදිත, අපනයන, කොළඹ වෙන්දේසියෙහි අලෙවි කළ ප්‍රමාණ හා ලන්ඩන් වෙන්දේසිය වෙත නැව්ගත කළ ප්‍රමාණයන්.

(රාත්තල් දශ ලක්ෂ)

| වර්ෂය | නිෂ්පාදිතය | අපනයන | | කොළඹ වෙන්දේසියට ඉදිරිපත්වූ ප්‍රමාණය | කෙලින්ම ලන්ඩනයට නැව්ගත කළ ප්‍රමාණය | පෞද්ගලික අලෙවිකිරීම* |
|---|---|---|---|---|---|---|
| | | රේගු සංඛ්‍යා | තථ්‍ය නැව්තොග | | | |
| 1965 .. | 503 | 495 | 474 | 368 | 125 | — |
| 1966 .. | 490 | 441 | 441 | 359 | 108 | — |
| 1967 .. | 487 | 478 | 480 | 369 | 110 | 5 |
| 1968 .. | 496 | 460 | 446 | 369 | 111 | 5 |
| 1969 .. | 484 | 445† | 417 | 387 | 88 | 5 |
| 1970 .. | 468 | 460† | 465 | 373 | 91 | 4 |

මූලයන්: තේ පාලක තැනගේ පාලන වාර්තා
ලංකා රේගු වාර්තා
කොළඹ තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමය.

* පෞද්ගලික තේ අලෙවි කිරීම ක්‍රියාත්මක වූයේ 1967 මාර්තු 1 දය.
† ක්ෂණික තේ ද ඇතුළත්වයි.

1. තේ පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල සංඛ්‍යා

### රටවල් අනුව අපනයනයන්

1970 දී ඇගේ කොටස සියයට 4·5 කින් වැඩි කර ගනිමින්, එක්සත් රාජධානිය ලංකාවේ ප්‍රධානතම ගැනුම්කරුවා වූවාය. ඉකුත්වූ වර්ෂයේදී මෙන්ම, ඇමෙරිකා එක්සත් ජනපදය දෙවන ස්ථානයෙහි රැඳී සිටි අතර, ඔස්ට්‍රේලියාව, ඉරාකය, සහ දකුණු අප්‍රිකා සංගමය ඊළඟට වැදගත් ගැනුම්කරුවෝ වූහ. 1969 හා 1970 වර්ෂයන්හි රටවල් අනුව අපනයන වර්ගීකරණයක්, තේ අපනයනයන්ගේ මුළු පරිමාව තුළ ඒවාහි ප්‍රතිශතක කොටස් සහිතව II (ඒ) 5 සංඛ්‍යා සටහනේ දැක්වේ.

**II (ඒ) 5 වැනි සංඛ්‍යා සටහන**

**රටවල් අනුව තේ අපනයන වර්ගීකරණය හා ප්‍රතිශතක කොටස්**

(රාත්තල් දශ ලක්ෂ)

| රටවල් | තේ අපනයන පරිමාව (රාත්තල් දශ ලක්ෂ) | | මුළු පරිමාවෙහි ප්‍රතිශතකය | |
|---|---|---|---|---|
| | 1969 | 1970 | 1969 | 1970 |
| එක්සත් රාජධානිය .. .. | 131·3 | 156·1 | 29·5 | 34·0 |
| ඇමෙරිකා එක්සත් ජනපදය .. .. | 45·4 | 39·7 | 10·2 | 8·6 |
| ඔස්ට්‍රේලියාව .. .. .. | 34·0 | 28·8 | 7·6 | 6·3 |
| ඉරාකය .. .. .. | 33·2 | 28·3 | 7·5 | 6·2 |
| දකුණු අප්‍රිකා සංගමය .. .. | 27·3 | 25·9 | 6·1 | 5·6 |
| අනිකුත් රටවල් .. .. .. | 174·0 | 180·9 | 39·1 | 39·4 |
| මුළු එකතුව .. .. | 445·2 | 459·7 | 100·0 | 100·0 |

මූලය: ලංකා රේගු වාර්තා.

### කොළඹ වෙන්දේසි

1970 දී කොළඹ වෙන්දේසිවල අලෙවිවූ සියලුම තේවල සාමාන්‍ය ශුද්ධ මිල රාත්තල රුපියල් 1·63 ක් වූ අතර, 1969 ට වඩා රාත්තල ශත 10 කින් හෙවත් සියයට 6 කින් ඉහළ යාමක් සිදුවිය. මෙම වැඩිවීම උස් බිම් හා මැදි බිම් වගා තේවලට සීමාවූ අතර පහත් බිම් වගා තේවල මට්ටම පෙර වර්ෂයෙහි මට්ටමේම නොවෙනස්ව පැවැත්තේය. රුපියල් 1·58 ක් වූ මැදි බිම් තේ මිළ ශත 18 ක ඉහළ යාමක්ද රුපියල් 1·92 ක් වූ උස් බිම් තේ මිල ශත 12 ක ඉහළ යාමක්ද පෙන්නුම් කළේය.

1969 සැප්තැම්බර් මාසයේ මැදදී පටන්ගත් තේ මිල ඉහළ යාම, 1970 පළමුවන කාර්තුවේදී නොනැවත පැවතී, දෙවන කාර්තුවේදී පහළ වැටීමක් සටහන් කරමින් රාත්තලක සාමාන්‍ය ශුද්ධ මිල රුපියල් 1·58 දක්වා පහළ වැටුණි. මෙය උස් හා මැදි බිම් වගාවන්හි තේ මිලෙහිද පිළිබිඹු කළ අතර, පළමුවන කාර්තුව අවසානයේදී පිළිවෙලින් රාත්තලක මිල රුපියල් 1·95 හා රුපියල් 1·58 සිට රුපියල් 1·80 හා රුපියල් 1·51 දක්වා පහත වැටුණි. කෙසේ වෙතත් පහත් බිම් වගා තේ රාත්තලක මිල රුපියල් 1·37 හි නොවෙනස්ව පැවතුණි. සාමාන්‍ය ශුද්ධ මිලේ මෙලෙස පහළ වැටීමක් වූයේ ඌව හා දික්ඔය තේවල තත්ත්වය වාරිකව පහත වැටීම නිසා වන්නට ඇත. මෙම වාරයේ තේ, නිසැකවම වඩා ගණනාවක් තුළ බලපොරොත්තු සුන්කරනු ලැබූවක් ලෙස පවසා ඇති අතර, කැපී පෙනෙන වාරික ලක්ෂණවලින් හා රසයෙන් යුත් තේ ලැබුණේ ඉතා සුළු ප්‍රමාණයකි.[1] කෙසේ වෙතත් 1969 දෙවැනි කාර්තුව හා සසඳා බලන විට,

1. සීමාසහිත ෆෝබ්ස් හා වෝකර්, තේ වෙළෙඳපල වාර්තා අප්‍රියෙල් හා ජුනි පි·3

උස් හා මැදි බිම් වගා තේ සැහෙන වර්ධනයක් පෙන්නුම් කළේය. උස් බිම් වගා තේ ශත 23 කින් හා මැදි බිම් වගා තේ ශත 33 කින් ඉහළ ගිය අතර, පහත් බිම් වගා තේ මිල ඉහළ ගොස් ඇත්තේ ශත 6 කින් පමණි. මෙහිදී පෙන්නුම් කරනු ලැබූ තියුණු මිල විශේෂණයන්ට හේතුවී ඇත්තේ 1969 දෙවන කාර්තුව තුළ වූ තේ මිල ගණන්වල පහත වැටීමයි. වර්ෂයේ තෙවැනි කාර්තුවෙහි තේ රාත්තලක සාමාන්‍ය ශුද්ධ මිල රුපියල් 1·76ක්වූ ලෙස සංවර්ධනය අගෝස්තු[2] මාසය තුළදී බී.ඕ.පී. හා බී.ඕ.පී. කුඩු දෙවර්ග යෙහිම වාර්තාගත මිලක් පෙන්නුම් කළ ඌව දිස්ත්‍රික්කයේ තෝරා ගත් හොඳම වර්ගයේ තේ සඳහා දැඩි ඉල්ලුම නිසා වූවකි. මිල ඉහළ යාම කෙරෙහි වගකිවයුතු තවත් සාධකයක් වූයේ සෝ. ස. ස. සං. ගනුවා වෙන්දේසියට නැවත සහභාගිවීමයි. 1970 සිවවන කාර්තුවේදී තේ රාත්තලක සාමාන්‍ය ශුද්ධ මිල රුපියල් 1·56 ක්වූ අතර, වර්ෂයේ තුන්වන කාර්තුව හා 1969 සිවවන කාර්තුව හා සසඳා බලන කළ ඒ පිළිවෙලින් ශත 20 කින් හා ශත 8 කින් පහත වැටීමකි.

සාමාන්‍ය ශුද්ධ මිලේ මෙලෙස පහත වැටීම, උස් බිම් හා මැදි බිම් වගා තේවල සාමාන්‍ය මිල; වර්ෂයේ තෙවන කාර්තුව හා සසඳන කල පිළිවෙලින් රාත්තලක් ශත 44 කින් හා ශත 21 කින් පහත වැටීම නිසා සිදුවූවක් වශයෙක් සැලකිය හැකිය. කෙසේ වෙතත්, පහත් බිම් වගා තේ මිල රාත්තලක් ශත 5 කින් ඉහළ යාමක් ලේඛන ගතවී ඇත. II (ඒ) 6 සංඛ්‍යා සටහනෙන් තේ නිෂ්පාදිතය, අපනයනය හා මිල පිළිබඳ දත්ත සපයයි.

### II (ඒ) 6 වැනි සංඛ්‍යා සටහන

### තේ නිෂ්පාදිතය, අපනයන හා මිල – 1966 – 1970

| වර්ෂය | නිෂ්පාදිතය | අපනයනය | | කොළඹ වෙන්දේසියේ රාත්තලක සාමාන්‍ය ශුද්ධ මිල රුපියල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (රාත්තල් දශ ලක්ෂ) | ප්‍රමාණය (රාත්තල් දශ ලක්ෂ) | රාත්තලක නැ. වි. ස. මිල රුපියල් | උස්බිම් වගාව | මැදිබිම් වගාව | පහත් බිම් වගාව | සියළු තේ |
| 1966 .. .. | 490 | 441 | 2·33 | 1·84 | 1·46 | 1·37 | 1·57 |
| 1967 .. .. | 487 | 478 | 2·22 | 1·82 | 1·47 | 1·20 | 1·50 |
| 1968 .. .. | 496 | 460 | 2·52 | 1·93 | 1·67 | 1·63 | 1·75 |
| 1969 .. .. | 484 | 445 | 2·39 | 1·80 | 1·40 | 1·38 | 1·53 |
| 1970 .. .. | 468 | 460 | 2·44 | 1·92 | 1·58 | 1·38 | 1·63 |
| 1969 1 වැනි කාර්තුව | 124 | 118 | 2·47 | 1·89 | 1·44 | 1·42 | 1·58 |
| 2 වැනි කාර්තුව | 149 | 127 | 2·40 | 1·57 | 1·18 | 1·31 | 1·35 |
| 3 වැනි කාර්තුව | 93 | 123 | 2·27 | 1·88 | 1·45 | 1·30 | 1·54 |
| 4 වැනි කාර්තුව | 118 | 76 | 2·44 | 1·88 | 1·58 | 1·48 | 1·64 |
| 1970 1 වැනි කාර්තුව | 115 | 99 | 2·41 | 1·95 | 1·58 | 1·37 | 1·64 |
| 2 වැනි කාර්තුව | 140 | 137 | 2·44 | 1·80 | 1·51 | 1·37 | 1·58 |
| 3 වැනි කාර්තුව | 94 | 133 | 2·44 | 2·20 | 1·72 | 1·37 | 1·76 |
| 4 වැනි කාර්තුව | 119 | 90 | 2·45 | 1·76 | 1·51 | 1·42 | 1·56 |

මූලයන්: තේ පාලක තැනගේ පාලන වාර්තා;
ලංකා රේගු වාර්තා;
කොළඹ තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය.

**තේ අපනයන බද්ද ප්‍රතිදාන යෝජනා ක්‍රමය**

1970 වර්ෂය මුළුල්ලේම තේ අපනයන බද්ද ප්‍රතිදාන යෝජනා ක්‍රමය කිසිත් වෙනසක් නොමැතිව. ක්‍රියාත්මක කරනු ලැබිණි. ප්‍රතිදානයන් දෙනු ලැබූ තේ ප්‍රමාණයන් හා 1970 වර්ෂය තුළදී ප්‍රතිදාන වශයෙන් මුළු ගෙවීම පිළිබඳ විස්තර II (ඒ) 7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

2. ඕමාසහිත ෆෝබ්ස් හා වෝකර්, තේ වෙළෙඳ පල වාර්තා ජූලි සැප්තැම්බර් 1970 පි. 4

## II (ඒ) 7 වැනි සංඛ්‍යා සටහන

### තේ අපනයන බදු ප්‍රතිදාන යෝජනා ක්‍රමය - කොළඹ වෙන්දේසි

| | ප්‍රතිදානයන් ගෙවූ ප්‍රමාණයන් රාත්තල් | ගෙවූ ප්‍රතිදානයන්හි වටිනාකම රුපියල් |
|---|---|---|
| උස් බිම් වගාව .. .. .. | 118,660,510 | 5,933,025 |
| මැදි බිම් වගාව .. .. .. | 121,950,083 | 16,217,969 |
| පහත් බිම් වගාව .. .. .. | 122,986,719 | 20,095,052 |
| එකතුව .. .. .. | 363,597,312 | 42,246,046 |

මූලය: තේ පාලන දෙපාර්තමේන්තුව.

**දේශීය පරිභෝජනය**

1969 දී රාත්තල් දශලක්ෂ (40·6) ක් වූ දේශීය තේ පරිභෝජනය 1970 දී රාත්තල් දශලක්ෂ 41·6 ක් වශයෙන් ආගණිත කර ඇත. මෙය 1970 නිෂ්පාදනය කළ මුළු තේ ප්‍රමාණයෙන් සියයට 8·9 කට ආසන්න වේ.

**ලන්ඩන් වෙන්දේසි**

ලන්ඩන් වෙන්දේසිවල අලෙවිවූ තේවල සාමාන්‍ය මිල 1970 දී රාත්තලක් පැන්ස 49·7 ක්වූ අතර, එය 1969 ට වඩා රාත්තල පැන්ස 5·60 කින් හා 1968 ට වඩා රාත්තලක් පැන්ස 2·08 කින් ඉහළ මිලකි. මෙම මධ්‍යස්ථානයේ වූ මිල ඉහළ යාම් සියළුම රටවල් විසින් බෙදගනු ලැබිණි. ලන්ඩන් වෙන්දේසිවල අලෙවිවූ තේ පරිමාව අඩු වීම, (විශේෂයෙන් ඉන්දියානු හා ලංකා තේ), 1970 දී අපනයන කිරීමට තිබූ කළු තේ වලින් රාත්තල් දශලක්ෂ 90 ක් අපනයන කිරීමෙන් වැළකී සිටීමට තේ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් එකහවූ මොරිෂස් තේ සම්මුතියට අනුව ක්‍රියාකිරීමෙන් තත්ත්වයෙන් උසස් තේ සැපයුම ඉහළ යාම, අගෝස්තු[1] දක්වා තොග මට්ටම තියුණු ලෙස පහත වැටීම, සහ 1969 සාමාන්‍ය මිල පහත දමමින් එකී වර්ෂයේ විකුණුම් වටිනාකම්හි වූ පහළ වැටීම, යනාදී සාධක 1970 දී ලන්ඩන් වෙළෙඳ පලේ තේ මිල ඉහළ යාමට තුඩුදී ඇත. ලන්ඩන් වෙන්දේසිවලදී අලෙවි කල තේ ප්‍රමාණයන් මූලාරම්භක රටවල් සහ ලැබූ සාමාන්‍ය මිල ගණන් පිළිබඳ දත්ත II (ඒ) 8 සංඛ්‍යා සටහනේ දැක්වේ.

## II (ඒ) 8 සංඛ්‍යා සටහන

### මූලාරම්භක රටවල් හා සාමාන්‍ය මිල ගණන් අනුව ලන්ඩන් වෙන්දේසිවලදී අලෙවි වූ තේ ප්‍රමාණයන්

| රටවල් | ලන්ඩන් වෙන්දේසි වලදී අලෙවි වූ ප්‍රමාණයන් (රා. ද. ල.) | | | | සාමාන්‍ය මිල ගණන් (රාත්තල - පැන්සවලින්) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1967 | 1968 | 1969 | 1970 | 1967 | 1968 | 1969 | 1970 |
| 1· උතුරු ඉන්දියාව .. | 113·3 | 131·4 | 133·1 | 67·1 | 53·71 | 48·66 | 45·25 | 50·91 |
| 2· දකුණු ඉන්දියාව .. | 12·1 | 15·5 | 10·9 | 5·6 | 42·48 | 42·26 | 34·44 | 44·00 |
| 3· සමස්ථ ලංකා .. | 96·2 | 103·9 | 94·5 | 80·4 | 52·33 | 49·30 | 48·51 | 51·14 |
| 4· සමස්ථ අප්‍රිකානු .. | 56·0 | 72·9 | 77·4 | 81·5 | 40·60 | 44·12 | 38·88 | 47·91 |
| 5· එකතුව .. .. | 284·3 | 328·4 | 320·5 | 237·5 | 49·81 | 47·63 | 44·11 | 49·71 |

මූලය: ලන්ඩන් තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය.

1. 1969 අගෝස්තුවලදී පහළ වැටීමට පටන් ගත් එක්සත් රාජධානියේ තේ තොග 1970 අගෝස්තු දක්වා නොනැවත පහත වැටිණි. අගෝස්තු වලින් පසු මේ උපනතියේ විපරීත බවක් දිස්විය මෙයට හේතු වූයේ එ. රා. ට නැව් ගත කළ තේ වරාය වැඩ වර්ජනය නිසා තාවකාලිකව මහාද්වීපික වරායන් කරා යැවීමයි වැඩ වර්ජනය අවසානවීමත් සමග වර්ෂයේ දෙවන භාගයේදී එ. රා. යේ තේ තොග තත්ත්වයේ වර්ධනයකටත්, ප්‍රතිඵලයක් වශයෙන් තේ මිල පහළ වැටීමකටත් තුඩුදුනි.

1970 ලන්ඩන් වෙන්දේසි වලදී විකුණනු ලැබූ සියළුම ගණයේ ලංකා තේවල රාත්තලක සාමාන්‍ය මිල පැන්ස 51·14 ක් වූ අතර එය 1969 ට වඩා රාත්තලක් පැන්ස 2·63 කිනුත්, 1968 ට වඩා රාත්තලක් පැන්ස 1·84 කිනුත් ඉහළ මිලකි. ගතවූ වර්ෂ දෙකෙහි ඉහළම සාමාන්‍ය මිලක් වාර්තාගත කළ ලංකා තේවලට හිමිවූ තැන 1970 කෙන්යානු තේ විසින් හිමි කරගනු ලැබිණි.[1] සාමාන්‍ය මිලෙහි වර්ධනය සියලුම තෙවැදූරුම් තේ වර්ග විසින් හිමිකර ගන්නා ලදී. විශාලතම වර්ධනයක් වූයේ රාත්තලක් පැන්ස 7·81 කින් ඉහළ ගිය පහත් බිම් වගා තේවලය. මැදි බිම් වගා තේ රාත්තලක සාමාන්‍ය මිල පැන්ස 3·39 කින් ඉහළ ගිය අතර උස් බිම් වගා තේ රාත්තලක සාමාන්‍ය මිල ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත්තේ පැන්ස 0·84 කිනි. 1970 දී, මැදි හා පහත් බිම් වගා තේවල සාපේක්ෂ මිලේ වර්ධනය; විකුණුම් වටිනාකම්හි පරිහානිය නිසා 1969 එකී තේවල සාමාන්‍ය මිල පහත වැටීම සහ එක්සත් රාජධානියේ තේ තොග තියුණු ලෙස පහළ වැටීම සමග 1970 දී එම තේ සඳහා ඉල්ලුම ඉහළ යාමත් නිසා සිදුවූවකි.

තේ නිෂ්පාදනයේ යෙදී සිටින ප්‍රධාන පෙළේ රටවල 1970 තේ නිෂ්පාදිතය රාත්තල් දශලක්ෂ 1670 වශයෙන් ගණන් බලා ඇති අතර, එය 1969 ට වඩා රාත්තල් දශලක්ෂ 52 ක ඉහළ යාමකි.[2] (නැගෙනහිර අප්‍රිකානු දත්ත ජනවාරි සිට නොවැම්බර් දක්වා කාල පරිච්ඡෙදය වෙනුවෙනි.)

**ක්ෂණික තේ**

1970 ක්ෂණික තේ නිෂ්පාදිතය රාත්තල් 248,895 ක් වූයෙන් 1969 ට වඩා රාත්තල් 51,677 නැතහොත් සියයට 17·2 ක පහළ වැටීමක් දක්විණි.[3] 1968 ක්ෂණික තේ නිමැවුම රාත්තල් 297,022 ක් විය. 1970 දී රුපියල් දශලක්ෂ 2·5 ක් වටිනා ක්ෂණික තේ රාත්තල් 236,321 ක් අපනයනය කළ බව රේගු වාර්තාවල සටහන්වී ඇත. 1968 ට අදල සංඛ්‍යා රාත්තල් 312,437 ක් වන අතර, එහි වටිනාකම, රුපියල් දශලක්ෂ 3·9 කි. එක්සත් රාජධානියට අපනයනය කළ ප්‍රමාණය රාත්තල් 154,937 ක් නැතහොත් මුළු අපනයනයෙන් සියයට 66 ක් වෙයි. ජර්මන් ෆෙඩරල් ජන රජය, ජපානය හා ඕස්ට්‍රේලියාව වෙත අපනයනයන් පිළිවෙලින් රාත්තල් 27,598 රාත්තල් 19,423 හා රාත්තල් 18,073 ක් විය.

**පැකට් කළ තේ අපනයන**

ගතවූ වර්ෂයන්හි සැළකියයුතු ලෙස වර්ධනයක් පෙන්නුම් කළ පැකැට්වල අසුරන ලද තේ අපනයන 1970 දී රාත්තල් දශලක්ෂ 17·0 දක්වා, රාත්තල් දශලක්ෂ 1·9 කින් ඉහළ ගොස් ඇත. 1967 සිට ක්‍රමික ඉහළයාමක් දක්වූ ලංකාවෙන් අපනයනය කළ පැකට්වල අසුරන ලද තේවල වටිනාකම සමාලෝචනයට බඳුන්වන වර්ෂයේ දී ඉහළ යන උපනතියක් දක්වමින් රුපියල් දශලක්ෂ 41·6 දක්වා, රුපියල් දශලක්ෂ 4·3 කින් ඉහළ ගොස් ඇත. පැකැට්වල අසුරන ලද තේ වලින් සියයට 75 ක් පමණ, 1970 දී අපනයනය කරන ලද්දේ මැද පෙරදිග රටවල් වෙතය. රුපියල් දශලක්ෂ 26·8 ක් වටිනා රාත්තල් දශලක්ෂ 11·8 ක් මිලට ගත් ලිබියාව, ලංකාවේ පැකැට් කළ තේ මිළට ගත් විශාලතම ගැනුම් කරුවා විය.

---

1. 1969 දී ලංකා හා කෙන්යානු තේවල මිල විශේෂණය වූයේ ලංකා තේ රාත්තලක් කෙන්යානු තේ රාත්තලකට වඩා පැන්ස 0·33 කින් වුවත්, 1970 දී කෙන්යානු තේ රාත්තලක් ලංකා තේ රාත්තලකට වඩා පැන්ස 1·83 කින් ඉහළ ගොස් ඇත.
2. සීමාසහිත ජෝන්, කීල්. තොම්සන් වයිට, 1971 වර්ෂයේ පෙබරවාරි සතිපතා තේ වෙළෙඳ පල වාර්තා.
3. දත්ත ලබාගෙන ඇත්තේ තේ පාලන දෙපාර්තමේන්තුවෙනි.

**ජාත්‍යන්තර තේ සම්මේලනය**

තේ සම්බන්ධයෙන්, ආ. කෘ. සං. යේ උපදේශක කමිටුව විසින් 1970 නොවැම්බර් මස නවදිල්ලියේදී පවත්වනු ලැබූ රැස්වීමකදී, රාත්තල් දශලක්ෂ 1311 ක්වූ 1970 මුළු අපනයනය 1971 දී ද පවත්වාගෙන යාමට තීරණය කරන ලදී. එහෙත් එක් එක් රටවල් සඳහා සළාකයන් නියම කර ගැනීම රෝමයේ පැවැත්වීමට නියමිත ඊළඟ රැස්වීමට කල් තැබූහ. තේ මිල ස්ථාවරව පවත්වා ගැනීමට දිගු කාලීන ක්‍රියා මාර්ගයක් ඇතිකර ගැනීම සඳහා අපනයන හා ආනයන දෙරටවල්ම එක්ව කටයුතු කළ යුතු බවට පොදු එකඟතාවක් විය.

තේ පරිභෝජනය ඉහළ මට්ටමකට පත් කළ හැකි අන්දම සහ තේ සඳහා අයකරනු ලබන අධි තීරු බදු හා අපනයන ගාස්තු අඩුකර ගැනීමක් සඳහා ආනයන රටවල් සමග සාකච්ඡා පැවැත්වීමේ අවශ්‍යතාව ගැන කමිටුව විසින් සැළකිල්ල යොමු කරන ලදී. අපනයන සැපයුම්වල කිසියම් වර්ධනයක්, ලෝක ඉල්ලුමේ වර්ධනයට සරිලන ලෙස පමණක් සිදුවිය යුතු බවටත්, ඵලදායි හා සමාණතා මිලක් පවත්වා ගත හැකි වන්නේ එබඳු ක්‍රියා මාර්ගයකින් පමණක් බවටත් අපනයන රටවල් එකඟ විය. මේ කරුණු සම්බන්ධ තීරණයක් ගැනීම ඊළඟ රැස්වීමට කල් තබන ලදී.

**රබර්**

**නිෂ්පාදනය**

1969 වර්ෂයේදී රාත්තල් දශ ලක්ෂ 4.6ක සුළු ප්‍රමාණයකින් වැඩි වූ රබර් නිෂ්පාදිතය 1970 දී රාත්තල් දශ ලක්ෂ 18.4ක හෙවත් සියයට 5.5ක සීඝ්‍ර වැඩිවීමක් පෙන්නුම් කෙළේය. අන්තර් මෝසම් සුලං වර්ෂාව නිසා කිරි කැපීමේ කටයුතු වලට බාධා ඇති වුවද, සාමාන්‍ය වශයෙන් 1970 වර්ෂයේදී රබර් නිෂ්පාදනය සඳහා හිතකර කාල ගුණයක් පැවැත්තේය. නිෂ්පාදනය වැඩිවීම කෙරෙහි බල පෑ තවත් හිතකර සාධකයක් නම් නැවත වගා කළ බිම් මෙම වර්ෂය තුළදී ඵල දැරීමට වීමයි.

රාත්තල් දශ ලක්ෂ 211.0 වූ ෂීට් රබර් නිෂ්පාදිතය 1969 වර්ෂයේදීට වඩා රාත්තල් දශ ලක්ෂ 16.4ක හෙවත් සියයට 8.5ක ඉහළ යාමක් පෙන්වූයෙන් 1970 මුළු රබර් නිෂ්පාදනය වැඩිවීමෙහිලා මෙය විශේෂ බලපෑමක් ඇති කළේය. 1969 වර්ෂයේදී රාත්තල් දශ ලක්ෂ 136.3ක්වූ ක්‍රෙප් රබර් නිෂ්පාදිතය 1970 දී රාත්තල් දශ ලක්ෂ 138.3 දක්වා රාත්තල් දශ ලක්ෂ 2ක සුළු වැඩිවීමක් පෙන්නුම් කළේය.

**පරිභෝජනය**

1970 වර්ෂයේදී ස්වභාවික රබර් පරිභෝජන ප්‍රමාණය වූ රාත්තල් දශ ලක්ෂ 8.3, වර්ෂයේ මුළු රබර් නිෂ්පාදිතයෙන් සියයට 2·4 වූ අතර මෙය පෙර වර්ෂයේදීට වඩා රාත්තල් දශ ලක්ෂ 0.5ක ඉහළ යාමකි.

**අපනයන**

1969 වර්ෂය හා සසඳන කල 1970 වර්ෂයේදී අපනයනය කරන ලද රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 39.4 හෙවත් සියයට 12.5ක සැළකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙළේය.[1] 1970 ජනවාරි මාසයේදී කොළඹ වරායේ පැවති වැඩ වර්ජනය නිසා අපනයන කරුවනට මුහුණපෑමට සිදුවූ දුෂ්කරතාව හැර ඉතිරි කාල පරිච්ඡේදයේදී අපනයන කටයුතු ක්‍රමානුකූලව සිදුවිය.

රබර් අපනයන ප්‍රමාණය වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය වූයේ ෂීට් රබර් අපනයන ප්‍රමාණය 1969දීට වඩා රාත්තල් දශ ලක්ෂ 42.0න් හෙවත් සියයට 24න් ඉහළ යාමයි.

II (ඒ 9) වැනි සංඛ්‍යා සටහනෙහි රබර් නිෂ්පාදිතය, අපනයන හා මිළ ගණන් පිළිබඳ තොරතුරු දක්වේ.

1. රේගු වාර්තා පදනම් කොට ගත් කල 1970 දී අපනයනය කරන ලද මුළු රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 354 ලෙස දැක් වුවද, 1970දී අපනයන කළ තථ්‍ය රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 340ක් විය.

## II (ඒ) 9 වැනි සංඛ්‍යා සටහන

## රබර් නිෂ්පාදිතය, අපනයන හා මිල

| වර්ෂය | නිෂ්පාදිතය රාත්තල් දශ ලක්ෂ | | | අපනයන රාත්තල් දශ ලක්ෂ | | | නැ. වි. ස. මිල රාත්තල රුපියල්. | | | කොළඹවෙළෙඳපලේ (රාත්තලක මිල රු.) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ෂීට් | ක්‍රේප් | සියලු | ෂීට් | ක්‍රේප් | සියලු | ෂීට් | ක්‍රේප් | සියලු | ආර්. ඇස්. ඇස්. නො. 1 | ලේටෙක්ස් ක්‍රේප් නො. ix |
| 1966 .. | 170·7 | 116·7 | 288·8 | 180·1 | 117·8 | 298·4 | 1·19 | 1·05 | 1·13 | 0·89 | 1·00 |
| 1967 .. | 187·5 | 126·5 | 315·7 | 163·3 | 127·4 | 290·9 | 1·04 | 0·89 | 0·97 | 0·79 | 0·88 |
| 1968 .. | 195·0 | 131·2 | 327·9 | 189·7 | 137·8 | 328·3 | 0·98 | 1·04 | 1·01 | 0·88 | 1·11 |
| 1969 .. | 194·6 | 136·3 | 332·5 | 179·7 | 135·1 | 314·8 | 1·34 | 1·41 | 1·37 | 1·04 | 1·16 |
| 1970 .. | 211·0 | 138·3 | 350·9 | 221·7 | 132·5 | 354·2 | 1·23 | 1·26 | 1·24 | 0·91 | 1·12 |
| **1970** | | | | | | | | | | | |
| 1 වැනි කා: . | 53·6 | 36·8 | 90·8 | 16·5 | 36·0 | 52·5 | 1·48 | 1·33 | 1·38 | 1·00 | 1·07 |
| 2 වැනි කා: . | 45·1 | 31·1 | 76·6 | 81·2 | 38·1 | 119·3 | 1·32 | 1·27 | 1·31 | 0·92 | 1·09 |
| 3 වැනි කා: . | 52·6 | 36·1 | 89·2 | 70·3 | 28·7 | 99·0 | 1·17 | 1·23 | 1·19 | 0·86 | 1·14 |
| 4 වැනි කා: . | 59·7 | 34·2 | 94·3 | 53·6 | 29·7 | 83·3 | 1·11 | 1·18 | 1·14 | 0·85 | 1·16 |

මූලයන්: රබර් පාලන දෙපාර්තමේන්තුව
ලංකා රේගු වාර්තා
කොළඹ රබර් වෙළඳුන්ගේ සංගමය.

### රටවල් අනුව අපනයන

රබර් මිළදී ගත් ප්‍රධාන ගැණුම්කරුවා ලෙස මහජන චීන සමූහාණ්ඩුව 1970දී ද දිගටම එම ස්ථානය පවත්වා ගත්තාය. මෙම වර්ෂයේදී චීන සමූහාණ්ඩුව මිළදී ගත් රාත්තල් දශ ලක්ෂ 187 (මුළු රබර් අපනයන වලින් සියයට 53 ක්) 1969 වර්ෂයේ එරට විසින් මිලදී ගන්නා ලද රාත්තල් දශ ලක්ෂ 158 (මුළු රබර් අපනයනවලින් සියයට 50ක්) හා සැසඳේ.

1969 හා 1970 වර්ෂයන් සඳහා රටවල් අනුව රබර් අපනයන පිළිබඳ සංඛ්‍යා තොරතුරු, අනුකූල ප්‍රතිශතකද සමග II (ඒ) 10 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## II (ඒ) 10 වැනි සංඛ්‍යා සටහන

## රටවල් අනුව රබර් අපනයනයන් හා ප්‍රතිශතකයන්

| රට | පරිමාව (රා. ද. ල.) | | මුළු ප්‍රමාණයෙහි ප්‍රතිශතකය | |
|---|---|---|---|---|
| | 1969 | 1970 | 1969 | 1970 |
| චීන මහජන සමූහාණ්ඩුව .. .. | 157·6 | 186·8 | 50·1 | 52·7 |
| පෝලන්තය .. .. .. | 14·3 | 26·3 | 4·5 | 7·4 |
| ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව .. .. | 20·3 | 23·0 | 6·4 | 6·5 |
| අමෙරිකා එක්සත් ජනපදය .. .. | 18·0 | 22·0 | 5·7 | 6·2 |
| සෝවියට් රුසියාව .. .. .. | 23·2 | 21·9 | 7·4 | 6·2 |
| රුමේනියාව .. .. .. | 13·4 | 13·3 | 4·3 | 3·8 |
| ජපානය .. .. .. | 9·0 | 8·7 | 2·9 | 2·5 |
| අනෙකුත් රටවල් .. .. .. | 59·0 | 52·2 | 18·7 | 14·7 |
| මුළු එකතුව .. .. .. | 314·8 | 354·2 | 100·0 | 100·0 |

මූලය: ලංකා රේගු වාර්තා.

වෙළෙඳ මිළ චලන

1970 වර්ෂයේ ජනවාරි මාසයේදී ආර්.ඇස්.ඇස්. නො. 1 ෂීට් රබර් රාත්තලක් සඳහා කොළඹ වෙළෙඳපලෙහි පැවති මිල වූ රු 1.05 ජාත්‍යන්තර වෙළෙඳපලෙහි රබර් මිල උපනතින් අනුව ගමන් කරමින් ඔක්තෝබර් මාසය වන විට රාත්තලකට රු. 0.83 දක්වා සීඝ්‍රයෙන් පහත බැස්සේය. මහජන චීන සමූහාණ්ඩුව නැවත රබර් මිලදී ගැනීම් ආරම්භ කිරීමෙන් පසුව ජාත්‍යන්තර රබර් මිල හොඳ අතට හැරෙන්නට වූයෙන් නොවැම්බර් මාසයේදී වෙළෙඳ පලේ රබර් මිළ රු. 0·88 දක්වා ශත 5කින් ඉහළ ගියේය. ආර්.ඇස්.ඇස්.නො. 1 ෂීට් රබර් සඳහා 1970 වර්ෂයේ සාමාන්‍ය මිල වූ රු. 0.91, 1969 වර්ෂයේ මිල හා සසඳන විට ශත 13කින් හෙවත් සියයට 12 5ක පහළ වැටීමක් පෙන්නුම් කරයි. නො. 1 ක්‍රෙප් රබර් හි කොළඹ වෙළෙඳපල මිලද ආර්.ඇස් ඇස්.නො. 1 ෂීට් රබර් මිල අනුව ගමන් කරමින් 1970 ජනවාරි මස රාත්තලකට රු. 1.09 සිට ඔක්තෝබර් මාසයේ රාත්තලට රු.0.92 දක්වා පහත බැස්සේය. නො. IX ක්‍රෙප් රබර් සඳහා 1970 වර්ෂයේ සාමාන්‍ය මිළ වූ රු. 1.12 පසුගිය වර්ෂය හා සසඳන විට රාත්තලකට ශත 4ක පහත වැටීමක් පෙන්නුම් කෙළේය.

ජාත්‍යන්තර වෙළෙඳපලෙහි රබර් මිල තත්ත්වය බලන විට 1969 ට වෙනස් ස්වරූපයක් ගනිමින් 1970 දී දිගටම රබර් මිල ක්‍රමයෙන් පහත වැටෙන්නට වූ අතර ඔක්තෝබර් මාසයේදී රාත්තලක් පැන්ස 18 දක්වා පහත වැටුණි. මෙය 1968 මැයි මාසයට පසුව ලන්ඩන් වෙළෙඳපලෙහි වාර්තා වී ඇති අඩුම මිල වේ. 1970 දී රබර් මිල පහල වැටීමට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැක්කේ පෙරදිග රටවල රබර් නිෂ්පාදනය වැඩිවීම හා තොග වැඩිවීම අභිමුඛයෙහි රබර් පරිභෝජනය සාමාන්‍ය වශයෙන් පහත වැටීමයි. පෙබරවාරි මාසයේ සිට මහජන චීන සමූහාණ්ඩුව වෙළෙඳපලට නොපිවිසීමත්, ඇමෙරිකා එක්සත් ජනපදය රැස්කර තිබූ රබර් තොග විකිණීම ආරම්භ කිරීමට සූදනම් වේය යන රාවයත් මිල පහත වැටීමට තුඩුදුන් හේතු අතර වේ. මැයි මාසයේ මැද භාගයේදී සාමාන්‍ය සේවා පාලනායතනය විසින් මසකට ටොන් 7000 බැගින් තොග මුදා හරින බව නිල වශයෙන් ප්‍රකාශ කරන තුරු වෙළෙඳපලෙහි විශ්වාසය ඝිනකරමින් තොග මුදා හැරීමේ තර්ජනය පැවැත්තේය. කෙසේ වුවද, මිල පහල වැටීමට ප්‍රතිකර්මයක් වශයෙනුත්, නිෂ්පාදක රටවලට සහනයක් වශයෙනුත් සැප්තැම්බර් මැද භාගයේදී තොග මුදා හැරීම් අත්හිටුවන ලදී.

නොවැම්බර් මාසයේදී සුළු වශයෙන් රබර් මිලදී ගැනීම් ආරම්භ කිරීමට පෙර මහජන චීන සමූහාණ්ඩුව රබර් වෙළෙඳපල කෙරෙහි එතරම් උනන්දුවක් දැක්වූයේ නැත. නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී මිලෙහි සුළු වැඩිවීම්වලට ඇගේ පිවිසීම බලපැවා විය හැකිය.

සාමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ස්වාභාවික රබර් පරිභෝජනය අඩුවීම කෙරෙහි බලපෑ මූලික හේතූන් අතර, ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති කම්කරු ආරාවුල්, එක්සත් රාජධානියෙහි ඩන්ලොප් වැඩ වර්ජනය හා මිලදී ගැනීමේ උනන්දුව අඩුවීම, අලුත් ඇනවුම් සිදු නොවීම ආදිය කැපී පෙනේ.

පොදුවේ බලන කල ලන්ඩන් වෙළෙඳපලෙහි ආර් ඇස්.ඇස්.නො. 1 ෂීට් රබර් රාත්තලක මිල වූ පැන්ස 20.3, 1969දීට වඩා රාත්තලකට පැන්ස 4·8ක හෙවත් සියයට 15 ක අඩුවීමක් පෙන්විය. සිංගප්පූරු වෙළෙඳපලෙහි 1970 සඳහා ෂීට් රබර්වල සාමාන්‍ය වාර්ෂික නැ.චි.ස. මිල වූ සිංගප්පූරු ශත 55·91 පසුගිය වර්ෂයේ මිලට වඩා රාත්තලකට ශත 13.80ක හෙවත් සියයට 20ක වඩා සීඝ්‍ර වූ පහත වැටීමක් පෙන්නුම් කෙළේය.

II (ඒ) 11 වැනි සංඛ්‍යා සටහනෙහි 1970 හා 1969 වර්ෂ සඳහා ලෝක රබර් සැපයුම, පරිභෝජනය සහ ස්වාභාවික රබර් හා කෘත්‍රිම රබර් තොග පිළිබඳව ජාත්‍යන්තර රබර් නිරීක්ෂණ කණ්ඩායම විසින් නිකුත් කර ඇති සංඛ්‍යා තොරතුරු දක්වා ඇත.

## II (ඒ) 11 වැනි සංඛ්‍යා සටහන

### ලෝකයේ ස්වාභාවික රබර් හා කෘත්‍රිම රබර් සැපයුම, පාරිභෝජනය හා තොග ප්‍රමාණ.

(මෙට්‍රික් ටොන්)

| | ස්වාභාවික රබර් | | කෘත්‍රිම රබර් | |
|---|---|---|---|---|
| | 1969 | 1970 | 1969 | 1970 |
| සැපයුම (ජනවාරි - සැප්තැම්බර්) .. | 2,100,000 | 2,140,000 | 3,384,000 | 3,652,750 |
| පාරිභෝජනය (ජනවාරි - සැප්තැම්බර්) .. | 2,200,000 | 2,162,500 | 3,290,000 | 3,407,500 |
| තොග* .. .. .. | 885,000 | 965,000 | 872,500 | 1,070,000 |

මූලය: රබර් සංඛ්‍යාන විවරණිකාව,

* සැප්තැම්බර් මස අගදී වූ ප්‍රමාණය.

**රබර් නිෂ්පාදකයන්ගේ සම්මේලනය**

1970 අගෝස්තු මාසයේදී මලයාසියාව, ලංකාව, තායිලන්තය, සිංගප්පූරුව හා දකුණු වියට්නාමය යන රටවල් රබර් නිෂ්පාදන රටවල සංගමයක් ලෙස එක් වූහ. ආරම්භකරුස්වීම වාරය 1970 ඔක්තෝබර් මස ක්වාලාලම්පූර්හිදී පවත්වන ලද අතර, ඒ ඒ රබර් නිෂ්පාදන රටවල රබර් වලට ස්ථිරවූත්, ඒකාකාර වූත් මිලක් ලබාගැනීම සඳහා ඒකාබද්ධ වෙළෙඳපල ක්‍රමයක් ඇතිකරලීමට මලයාසියාව විසින් කරන ලද යෝජනාව ඒකමතිකව පිළිගන්නා ලදී.

**පොල් නිෂ්පාදිතයන්**

1970 වර්ෂයේදී ආහාරයට ගන්නා මේද හා තෙල් වලට ලෝක වෙළඳපලෙහි ඉල්ලුම ඉහල යාම නිසාත්, දිගටම ඒවායේ සැපයුම් ඌණතාවන් වීම නිසාත් තෙල් මිල 1969 මට්ටමට වඩා ඉහළ මට්ටමක් කරා ඉහල ගියේය. පිලිපීනයෙහි සුළි සුළං නිසා එරට පොල් වගාවට වූ හානිය හේතුවෙන්, වැඩිපුර නිෂපාදනයක් සඳහා වූ ඉඩ කඩ ඇහිරී ගිය අතර, වර්ෂය අවසානය වන විට මිල හොඳ අතට හැරීමට මෙය හේතු විය.

**කොළඹ වෙළෙඳපල**

1970 දී ප්‍රධාන පොල් නිෂ්පාදිත සඳහා වූ කොළඹ වෙළෙඳපල මිල ජාත්‍යන්තර පොල් නිෂ්පාදිත සඳහා වූ මිල අනුව ගමන් කළේය. 1969 වර්ෂයේ මිල ගණන් හා සසඳන විට 1970 මුල් භාගයේදී කොප්පරා හා පොල් තෙල්හි සාමාන්‍ය මිලෙහි පහත වැටීමක් දිස්වූ නමුත් කපාපු පොල්හි මිල අඩුවූයේ මුල් දෙමාසයේදී පමණකි. පිලිපීනයෙහි විනිමය ප්‍රතිසංස්කරණවලට පසුව මාර්තු හා අප්‍රේල් මාසවලදී කොප්පරා මිලද හොඳ අතට හැරිණි. 1970 දෙවන භාගයේදී කොප්පරා, පොල් තෙල් හා කපාපු පොල්හි මිල පසුගිය වර්ෂයේ මිලට වඩා සැහෙන වැඩිවීමක් පෙන්නුම් කළේය.

**කොප්පරා**

1969 නොවැම්බර්වලදී එවකට පහත වැටී තිබූ කොප්පරා මිල ඉහල දැමීම අරමුණු කොට ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව කොප්පරා වෙන්දේසියට පිවිසි අතර, 1970 මැයි අවසානය දක්වා වෙන්දේසියෙහි සහභාගි වන්නට විය. මැයි මාසයේදී රු. 235.49ක්වූ කොප්පරා පාරමක සාමාන්‍ය මිල 1970 ඔක්තෝබර් දක්වා පහළට ගමන් කොට ඉල්ලුම වැඩිවීම නිසා දෙසැම්බර් මාසය වන විට රු. 251.36 දක්වා ඉහළ ගියේය. 1970 වර්ෂයේ කොළඹ වෙළෙඳපලෙහි කොප්පරා පාරමක සාමාන්‍ය මිල වූ රු. 247·56, 1969 සාමාන්‍ය මිලට වඩා රු. 9.68ක හෙවත් සියයට 4 ක ඉහළ යාමක් පෙන්නුම් කළේය.

සමාලෝචිත වර්ෂය තුල ලංකා පොල් මණ්ඩලයේදී අලෙවි කරන ලද කොප්පරා ප්‍රමාණය වූ පාරම් 442,263 (ටොන් දහස් 110.6) ඉකුත් වර්ෂයේ අලෙවි කරන ලද පාරම් 530,462 (ටොන් දහස් 132.6) සමග සැසඳේ.

**පොල් තෙල්**

1970 වර්ෂයේ මුල් භාගයේදී කෙළඹ වෙළෙඳපලේ පොල් තෙල්වල සාමාන්‍ය මිල පහළ වැටෙන උපනතියකින් ගමන් කොට ජුනි මාසය වන විට ටොන් එකක් රු. 1369.25 මට්ටමක පිහිටියේය. වර්ෂ හතක පමණ කාලයකට පසුව ඉන්දියාව ලංකා පොල් තෙල් වෙළෙඳපලට යළි පිවිසීමෙන් පසුව සැප්තැම්බර් මාසයේදී පමණ වෙළෙඳපලෙහි යහපත් තත්ත්වයක් දිස්වන්නට විය. පොල් තෙල් ටොන් එකක වාර්ෂික සාමාන්‍ය මිල වූ රු. 1,503.71, පසුගිය වර්ෂයේ මිලට වඩා රු. 49.24ක හෙවත් සියයට 3ක පමණ වැඩිවීමක් පෙන්නුම් කළේය.

**කපාපු පොල්**

ලංකාවේ කපාපු පොල් නිෂ්පාදකයන්ට සාධාරණ මිලක් ලබාගත හැකි වන පරිදි, 1970 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන්නා වූ "අවම-මිල" ක්‍රමයක් වාණිජ කටයුතු හා වෙළෙඳාම් පිළිබඳ අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලදී කපාපු පොල් මෝල් හිමියන් අපනයන කරුවන් හා ලංකා පොල් මණ්ඩලයේ අදහස් දැන ගැනීමෙන් පසුව ද්‍රව්‍ය මිලයට ගැනීමේ කොමසාරිස් විසින් මුලදී කපාපු පොල් රාත්තලක මිල රු. 0·75 ක් ලෙස නියම කරන ලදී. මෙම "අවම-මිල" ක්‍රමය පසුව අත්හැර දමන ලද අතර, ඒ වෙනුවට 1970 මැයි 3 වෙනි දින සිට වෙනත් ක්‍රමයක් ඇති කරන ලදී. මේ අනුව අපනයන කරුවන් විසින් කපාපු පොල් මෝල් හිමියනට ගෙවීමට නියමිත මිල ප්‍රකාශනය කරලීමේ ක්‍රමයක් පොල් මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලදී.

**අපනයන**

1970 දී පොල් නිෂ්පාදිතත්‍රයෙහි මුළු අපනයන ප්‍රමාණය (1967 = 100 පදනම් කොට ගත් මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයෙන් මනින ලද පරිදි) සියයට 3 කින් පහත වැටීමක් පෙන්නුම් කළ අතර, මෙය 1969 වර්ෂයේ සියයට 18 ක පහත වැටීම හා සැසඳේ. පොල් ගෙඩි සංඛ්‍යාව අනුව බලන විට 1970 දී පොල් අපනයනයන්ගේ මුළු ප්‍රමාණය වූ ගෙඩි දශ ලක්ෂ 874, 1969 අපනයන ප්‍රමාණය වූ ගෙඩි දශ ලක්ෂ 896 හා සැසඳේ. කොප්පරා හා කපාපු පොල් අපනයනයන් පිළිවෙලින් සියයට 20 කින් හා සියයට 5 කින් අඩු වූ අතර, පොල් තෙල් අපනයනයන් හොණ්ඩර 30 දහසකින් හෙවත් සියයට 3·5 කින් පසුගිය වර්ෂයේදීට වඩා වැඩි විය. 1970 දී පොල් නිෂ්පාදිත තුනෙහි අපනයන ප්‍රමාණය, අඩු වූවාට වඩා වේගයකින් ඒවායේ නැ. වි. ස. මිලයන්ගේ වැඩිවීම එම හිඟය පියවීමටත් වඩා ප්‍රමාණවත් විය. අවසාන ප්‍රතිඵලය වූයේ පොල් නිෂ්පාදනත්‍රයෙන් ලැබූ මුලු අපනයන ඉපයීම් ප්‍රමාණය වූ රු. දශ ලක්ෂ 237, පසුගිය වර්ෂයේදීට වඩා සියයට 7 ක ඉහළ යාමක් පෙන්නුම් කිරීමයි.

1966 – 70 කාලය සඳහා පොල් නිෂ්පාදිත ත්‍රයෙහි අපනයන ප්‍රමාණ හා අපනයන මිල පිළිබඳ සංඛ්‍යා තොරතුරු II (ඒ) 12 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්නුම් කෙරේ.

**II (ඒ) 12 වැනි සංඛ්‍යා සටහන.**

**ප්‍රධාන පොල් නිෂ්පාදිත – අපනයන පරිමාව සහ මිල**

**1966 – 1970**

| වර්ෂය | පරිමාව | | | | නැ. වි. ස. මිල | | |
|---|---|---|---|---|---|---|---|
| | පොල් තෙල් | කොප්පරා | කපාපු පොල් | එකතුව (ගෙඩි ප්‍රමාණය අනුව) | පොල් තෙල් | කොප්පරා | කපාපු පොල් |
| | හො: දහස් | හො: දහස් | හො: දහස් | ගෙඩි දහස් | ටොන් එක රු. ශත | පාරම රු. ශත | රාත්තල රු. ශත |
| 1966 .. | 1,457 | 417 | 930 | 1,071 | 1,489·00 | 294·60 | 0·60 |
| 1967 .. | 1,334 | 316 | 926 | 940 | 1,314·00 | 293·07 | 0·59 |
| 1968 .. | 1,261 | 425 | 1,382 | 1,096 | 2,108·80 | 396·25 | 1·06 |
| 1969 .. | 1,103 | 381 | 1,018 | 896 | 1,955·00 | 341·25 | 0·86 |
| 1970 .. | 1,142 | 305 | 967 | 874 | 2,037·60 | 371·99 | 0·91 |

මූලය: ලංකා රේගු වාර්තා.

**රටවල් අනුව අපනයන**

**කොප්පරා**

පසුගිය වර්ෂ කිහිපය තුළ ලංකාවේ කොප්පරා සඳහා ප්‍රධාන ගැනුම් කරුවා ලෙස සිටි ඉන්දියාව 1970 මුළු කොප්පරා අපනයන ප්‍රමාණයෙන් මිලදී ගත් සියයට 64 ක ප්‍රතිශතකය 1969 දී මිලට ගත් සියයට 52 ක ප්‍රතිශතකය හා සැසඳේ. ලංකා කොප්පරා මිලදී ගැනීමේ දෙවන ස්ථානය දරන්නා වූ පකිස්ථානය 1970 දී හොණ්ඩර 82,000 ක් හෙවත් මුළු කොප්පරා අපනයන ප්‍රමාණයෙන් සියයට 27 ක් මිලදී ගත්තාය. සෝවියට් රුසියාව විසින් 1970 දී මිලදී ගන්නා ලද ප්‍රමාණය වූ හොණ්ඩර 20,000, 1969 දී මිලට ගන්නා ලද ප්‍රමාණයට වඩා හොණ්ඩර 58,000 ක් හෙවත් සියයට 74 ක සැහෙන අඩු වීමක් පෙන්නුම් කළේය.

**පොල් තෙල්**

1970 වර්ෂයේදී සෝවියට් රුසියාව පොල්තෙල් හොණ්ඩර 255,000 ක් හෙවත් මුළු අපනයන ප්‍රමාණයෙන් සියයට 22 ක් මිලදී ගනිමින් ලංකාවේ ප්‍රධාන පොල් තෙල් ගැනුම්කරු ලෙස පෙනී සිටියේය. මහජන චීන සමූහාණ්ඩුව විසින් මිලදී ගන්නා ලද පොල් තෙල් හොණ්ඩර 205,000 ක් හෙවත් සියයට 18 ක ප්‍රමාණය 1969 දී ඇය විසින් මිලදී ගන්නා ලද හොණ්ඩර 274,000 හෙවත් සියයට 25 ප්‍රමාණය හා සැසඳේ. පකිස්ථානය, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව හා ඉතාලිය පිළිවෙලින් ඊලඟට 1970 දී ලංකා පොල්තෙල් මිලදී ගනුවන් ලෙස වැදගත් තැනක් දැරූහ.

**කපාපු පොල්**

ලංකාවේ කපාපු පොල් සඳහා ප්‍රධාන මිලදී ගනුවා වූ එක්සත් රාජධානිය විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද හොණ්ඩර 348,000 හෙවත් මුළු කපාපු පොල් අපනයන වලින් සියයට 36 ක ප්‍රමාණය පසුගිය වර්ෂයේදී මිලදී ගන්නා ලද හොණ්ඩර 332,000 හෙවත් සියයට 33 හා සැසඳේ. 1970 දී ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව විසින් මිලදී ගන්නා ලද හොණ්ඩර 109,000 ක ප්‍රමාණය පසුගිය වර්ෂයේට වඩා හොණ්ඩර 19,000 ක ප්‍රමාණයකින් හෙවත් සියයට 15 ක අඩුවීමක් පෙන්නුම් කරයි. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, නෙදර්ලන්තය සහ දකුණු අප්‍රිකාව 1970 වර්ෂයේදී පිළිවෙලින් හොණ්ඩර 75,000, හොණ්ඩර 67,000 හා හොණ්ඩර 42,000 බැගින් කපාපු පොල් අපනයනයන් මිලදී ගත්හ.

**දේශීය සෙසු අපනයන**

සමාලෝචනයට භාජනය වන්නා වූ වර්ෂය තුළදී දේශීය සෙසු අපනයනයන්ගේ මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 198 ක් වූ අතර, මෙය පසුගිය වර්ෂයේ එම වටිනාකමට වඩා රුපියල් දශලක්ෂ 37 ක හෙවත් සියයට 23 සැහෙන ප්‍රමාණයක වැඩිවීමක් පෙන්නුම් කරයි. සෙසු අපනයන ඉපයීම් වැඩිකරලීමෙහිලා ඒවායේ අපනයන පරිමාව සියයට 3 කින් වැඩිවීම ප්‍රධාන කොට බලපෑ අතර, ඒවායේ සාමාන්‍ය අපනයන මිල සියයට 2 ක අඩුවීමක් මගින් මෙම බලපෑම හීන කරන ලදී. (බැංකු දර්ශකය)

දේශීය සෙසු අපනයන මගින් වැඩිපුර විදේශ ඉපයීම් ලබාගැනීමේ සානුබල සපයන ලද ප්‍රබල සාධකයක් ලෙස 1968 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන්නා වූ විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය හැඳින්විය හැකිය. රුපියල්වලින් උපයා ගන්නා විදේශ විනිමය සඳහා මේ යටතේ ගෙවන ලද අතිරේක ගෙවීම සියයට 55 ලෙස පැවැත්තේය. මෙම වර්ෂය තුළදී දේශීය සෙසු අපනයන ඉපයීම් වැඩිකරලීමෙහිලා හේතු වූ තවත් කරුණක් නම් ඛනිජ තෙල් සුධ කිරීමෙන් පසු ඉතිරි වන්නාවූත්, පොහොර වගී සෑදීම සඳහා ප්‍රයෝජන-යට ගන්නා වූත් නැප්තා ජපානයට අපනයනය කිරීම මගින් රුපියල් දශලක්ෂ 9 ක් උපයාගත හැකි වීමයි. ස්වාභාවික මිනිරන් අපනයන කරුවනට ලැබෙන්නාවූ විශාල ලාභ ප්‍රමාණයන් අඩුකරලීම අරමුණු කොට, කලින් කොළඹ නැ·වි·ස. වටිනාකමින් සියයට 25 ක් ලෙස පැවති අපනයන තීරු බද්ද 1970 ඔක්තෝබර් මාසයේ සිට කොළඹ නැ·වි·ස. වටිනාකමින් සියයට 50 දක්වා වැඩි කරන ලදී. 1969 වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දෙන ලද පරිදි වි·වි·හි·ස. ක්‍රමය මගින් අනුබල ලබා වැඩිපුර අපනයන ගලා යාමක් දිස්විය හැක්කේ සැහෙන කාලයක් ගතවීමෙන් පසුවයි. එයද විය හැක්කේ නිෂ්පාදනයනට අහිතකර වූ සීමාවන් ඉවත්කර ප්‍රතිපත්තීන් සවිධානය වීමත් නවීකරණය වීමත් සිදු වුවහොත් පමණි. II (ඒ) 13 වැනි සංඛ්‍යා සටහනෙහි තෝරා ගන්නා ලද සුළු අපනයනයන් කිහිපයකගේ අපනයන පරිමාව, වටිනාකම හා නැ·වි·ස. මිල පිළිබඳ සංඛ්‍යා තොරතුරු දක්වා ඇත.

## II (ඒ) 13 වැනි සංඛ්‍යා සටහන
### තෝරාගත් සුළු අපනයන නිෂ්පාදිතයන්ගේ අපනයන පරිමාවන්, වටිනාකම් සහ සාමාන්‍ය නැ. වි. ස. මිල

| | ප්‍රමාණයෙහි ඒකකය | පරිමාව | | | | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | | සාමාන්‍ය නැ. වි. ස. මිල ( ඒකකයක මිළ ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1968 | 1969 | 1970 | 1969 ට වඩා 1970 හි වෙනස % | 1968 | 1969 | 1970 | 1969 ට වඩා 1970 හි වෙනස % | 1968 | 1969 | 1970 | 1969 ට වඩා 1970 හි වෙනස % |
| **පොල් නිෂ්පාදිත ගණය** | | | | | | | | | | | | | |
| කොහු—කෙඳි .. .. .. | හොණ්. දහස් | 563.0 | 506.7 | 474.0 | – 6.5 | 25.6 | 24.6 | 22.3 | – 9.3 | 43.35 | 48.63 | 47.13 | – 3.1 |
| කොහු—මෙට්ට .. .. | ,, | 1065.0 | 1180.3 | 1172.6 | – 0.7 | 25.5 | 25.4 | 24.8 | – 2.4 | 20.23 | 21.67 | 21.16 | – 2.4 |
| පොල්කටු අඟුරු .. .. | ,, | 319.1 | 385.2 | 583.4 | + 51.5 | 5.2 | 3.4 | 6.7 | + 97.1 | 16.34 | 8.90 | 11.53 | + 29.6 |
| අමු පොල් .. .. .. | ගෙඩි දහස් | 7.6 | 10.3 | 6.3 | – 38.8 | 3.3 | 4.2 | 2.9 | – 30.9 | 0.44 | 0.41 | 0.46 | + 12.2 |
| **කුළු බඩු ගණය** | | | | | | | | | | | | | |
| කුරුඳු කුරු .. .. .. | හොණ්. දහස් | 61.8 | 65.9 | 70.0 | + 6.2 | 32.9 | 33.8 | 28.4 | – 16.0 | 531.79 | 513.33 | 405.79 | – 20.9 |
| කුරුඳු පොතු .. .. .. | ,, | 16.6 | 21.6 | 12.7 | – 41.2 | 2.3 | 4.1 | 1.7 | – 58.5 | 141.30 | 191.11 | 134.02 | – 29.9 |
| ගම්මිරිස් .. .. .. | ,, | 16.2 | 17.9 | 16.9 | – 5.6 | 2.4 | 3.1 | 4.7 | + 51.6 | 146.53 | 173.12 | 279.42 | + 61.4 |
| කරදමුංගු .. .. .. | ,, | 2.5 | 3.2 | 4.0 | + 25.0 | 4.1 | 7.3 | 11.3 | + 54.8 | 1639.22 | 2297.00 | 2838.61 | + 23.6 |
| කරාබුනැටි .. .. .. | ,, | 1.0 | 4.6 | 5.5 | + 19.6 | 0.1 | 2.8 | 4.1 | + 46.4 | 130.22 | 617.35 | 756.41 | + 22.5 |
| **ඛනිජ ගණය** | | | | | | | | | | | | | |
| මිනිරන් .. .. | ,, | 212.6 | 224.8 | 192.6 | – 14.3 | 7.8 | 8.3 | 8.9 | + 7.2 | 36.91 | 36.78 | 46.39 | + 26.1 |
| ඉල්මනයිට .. .. .. | ,, | 1455.0 | 1667.2 | 1556.2 | – 6.7 | 2.6 | 4.1 | 4.2 | + 2.4 | 1.78 | 2.45 | 2.68 | + 9.4 |
| **අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදිත** | | | | | | | | | | | | | |
| කොකෝවා ඇට .. .. | ,, | 34.8 | 25.4 | 29.9 | + 17.7 | 7.3 | 7.0 | 7.2 | + 2.9 | 211.16 | 273.43 | 240.82 | – 11.9 |
| සකස් කළ දුම්කොළ .. .. | රාත්. දශලක්ෂ | 1.3 | 0.7 | 0.5 | – 28.6 | 5.1 | 2.9 | 2.2 | – 24.1 | 3.81 | 4.04 | — | – – |
| පැඟිරි තෙල් .. .. .. | රාත්. දහස් | 297.8 | 402.6 | 426.5 | + 5.9 | 1.2 | 1.8 | 1.9 | + 5.6 | 3.99 | 4.57 | 4.48 | – 2.0 |
| කුරුඳ කොළ තෙල් .. .. | ,, | 79.2 | 93.9 | 111.4 | + 18.6 | 0.8 | 1.0 | 1.1 | + 10.0 | 10.51 | 10.29 | 10.12 | – 1.7 |
| **මේද අම්ල ගණය** | | | | | | | | | | | | | |
| ග්ලිසරෝල් .. .. .. | හොණ්. දහස් | 24.8 | — | — | — | 1.9 | — | — | — | 78.61 | — | — | — |
| ග්ලිසරින් .. .. .. | ,, | 21.0 | 21.5 | 24.6 | + 14.4 | 2.0 | 1.2 | 1.5 | + 25.0 | 93.16 | 57.20 | 59.20 | + 3.4 |
| **නිෂ්පාදිත භාණ්ඩගණය** | | | | | | | | | | | | | |
| පදම් කළ හම් .. .. .. | ,, | 10.1 | 11.6 | 13.3 | + 14.7 | 1.8 | 3.2 | 3.6 | + 12.5 | 180.02 | 275.76 | 269.78 | – 2.2 |
| එළු හම් .. .. .. | ,, | 3.3 | 0.4 | ... | ... | 1.1 | 0.2 | ... | ... | 338.23 | 397.97 | — | — |
| වටිනා සහ වටිනාකමින් අඩු මැණික්ගල් .. | කැරට් දහස් | 196.0 | 136.6 | 184.9 | + 35.4 | 2.0 | 0.5 | 4.3 | + 760.0 | — | — | — | — |
| ස්වර්ණාභරණ සහ රන්කරුවන්ගේ භාණ්ඩ | — | — | — | — | — | 1.2 | 1.0 | 1.0 | ... | — | — | — | — |
| රෙදිවලින් නිම කළ ඇඳුම් .. .. | දුසිම් දහස් | 32.3 | 110.3 | 180.4 | + 63.6 | 4.2 | 3.3 | 7.8 | + 136.4 | — | — | — | – — |
| රබර් සහ හම් පාවහන් .. .. | ,, | 10.4 | 29.0 | 31.8 | + 9.7 | 0.3 | 1.5 | 1.0 | – 33.3 | 28.78 | 53.38 | 30.62 | – 42.6 |
| ඉහත සඳහන් ශීර්ෂයන්ගේ මුළු වටිනාකම .. | | | | | | 140.7 | 144.7 | 151.6 | – 4.8 | | | | |
| සියළුම අපනයන නිෂ්පාදිතයන්ගේ මුළු වටිනාකම .. | | | | | | 152.2 | 161.2 | 198.5 | + 23.1 | | | | |
| ඇතුළත්වූ ශීර්ෂයන්ගේ ප්‍රතිශතකය .. | | | | | | 92.4 | 89.8 | 76.4 | | | | | |

මූලය: ලංකා රේගු වාර්තා.

## තෝරාගත් සුළු අපනයන නිෂ්පාදිතයන්ගේ

| ශීර්ෂය | ප්‍රමාණය ඒකකය | පළමු වැනි කාර්තුව | | | දෙවැනි කාර්තුව | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1968 | 1969 | 1970 | 1968 | 1969 | 1970 |
| කොකෝවා[1] .. .. | හොණ්ඩර | 195·87 | 387·30 | 272·08 | 236·18 | 374·77 | 230·00 |
| කුරුඳු කුරු[2] .. .. | රාත්තල් | 4·71 | 6·00 | 4·95 | 5·05 | 5·43 | 4·74 |
| කුරුඳු පොතු[3] .. .. | පාරම | 287·25 | 511·04 | 260·07 | 397·08 | 476·13 | 277·54 |
| කරාබුනැටි[4] .. .. | රාත්තල් | 14·28 | 25·91 | 33·15 | 17·01 | 30·34 | 33·37 |
| පැඟිරි තෙල්[5] .. .. | ,, | 3·07 | 6·05 | 5·79 | 3·74 | 7·07 | 5·77 |
| පැපොල් කිරි, සුදු .. .. | ,, | 17·51 | 18·60 | 13·81 | 18·56 | 13·81 | 14·99 |
| පැපොල් කිරි,දුඹුරු .. .. | ,, | 8·12 | 10·14 | 9·25 | 10·13 | 6·73 | 9·87 |
| කොහු මෙට්ට[6] .. .. | හොණ්ඩර | 11·68 | 20·71 | 16·30 | 14·36 | 20·05 | 16·50 |
| කොහු කෙදි[7] .. .. | ,, | 30·71 | 47·63 | 38·65 | 36 75 | 47·11 | 38·00 |
| අමු පොල් ගෙඩි[8] .. .. | දහස් | 246·58 | 275·88 | 272·67 | 248·42 | 222·04 | 247·79 |
| පොල්කටු අඟුරු[9] .. .. | ටොන් | 331·46 | 153·63 | 179·17 | 272·08 | 132·38 | 315·58 |

1· වතු කොප්පරා නො· 1
2· ඉස්තරම / 0000
3· වැලි සහ කුඩුවලින් තොරව, මිලදී ගන්නන්ගේ ගබඩාවල නො ඇසුරු
4· නො· 1 අමු වතු
5· විකුණුම්කරුවන්ගේ ගබඩාවලින් බාහිර මිල
6· නො· 1 වර්ගය
7· වෙළුම් තුනක් සහිත
8· මධ්‍යම
9· ගැණුම්කරුවන්ගේ මලුවල·

II (ඒ) 14 (1) වැනි සංඛ්‍යා සටහන

## කොළඹ වෙළෙඳ පොළෙහි සාමාන්‍ය මිල

(ඒකකය රුපියල්)

| තෙවැනි කාර්තුව | | | සතරවැනි කාර්තුව | | | වාර්ෂික සාමාන්‍යය | | | වෙනස සියයට ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1968 | 1969 | 1970 | 1968 | 1969 | 1970 | 1968 | 1969 | 1970 | 1968 ට වඩා 1969 වෙනස | 1969 ට වඩා 1970 වෙනස |
| 294·34 | 388·83 | 221·75 | 311·17 | 318·04 | 229·88 | 259·39 | 367·24 | 239·19 | + 41·58 | − 34·9 |
| 5·03 | 5·32 | 4·39 | 5·42 | 5·30 | 4·26 | 5·05 | 5·51 | 4·58 | + 9·11 | − 16·9 |
| 494·88 | 443·75 | 267·45 | 616·67 | 301·54 | 265·04 | 448·97 | 433·11 | 267·52 | − 3·53 | − 38·2 |
| 20·00 | 28·99 | 27·05 | 21·08 | 28·79 | 22·54 | 18·09 | 28·51 | 29·03 | + 57·60 | + 1·8 |
| 4·65 | 5·85 | 6·13 | 5 48 | 6·30 | 6·42 | 4·23 | 6·31 | 6·03 | + 49·17 | − 4·4 |
| 19·37 | 16·39 | 14·98 | 19·43 | 13·44 | 14·35 | 18·72 | 15·56 | 14·53 | − 16·88 | − 6·6 |
| 11·08 | 8·63 | 9·25 | 10·36 | 8·83 | 9·25 | 9·92 | 8·58 | 9·40 | − 13·51 | + 9·6 |
| 19·25 | 17·20 | 16·50 | 21·34 | 15·41 | 18·21 | 16·66 | 18·34 | 16·88 | + 10·08 | − 8·0 |
| 44·31 | 42·59 | 37·47 | 49·64 | 40·00 | 38·00 | 40·35 | 44·33 | 38·03 | + 9·86 | − 14·2 |
| 264·96 | 186·46 | 200·84 | 260·50 | 228·33 | 228·71 | 255·12 | 228·18 | 237·50 | − 10·56 | + 4·1 |
| 190·67 | 125·96 | 385·67 | 167·25 | 131·42 | 400·42 | 240·37 | 135·85 | 320·21 | − 43·48 | + 135·7 |

මූලයන්; විවිධ නිෂ්පාදිතයන් සඳහාවූ සතිපතා වෙළෙඳ වාර්තා,
ලංකා වෙළෙඳ මණ්ඩලය—සතිපතා මිල ලැයිස්තු.

II (ඒ) 13 වැනි සංඛ්‍යා සටහනෙහි "දේශීය සෙසු අපනයන" 1970 මුළු අපනයන වටිනාකමින් සියයට 76 ක් වන අතර, ඒ 1969 දී සියයට 90 ක් ද වෙයි. 1970 දී වටිනාකම අඩු වීමට හේතු වූයේ මෙම සංඛ්‍යා සටහනට ඇතුළත් වී නැති අපනයනයන්ගේ වටිනාකම 1969 දී රු. දශලක්ෂ 1·6 සිට 1970 දී රු. දශ ලක්ෂ 20·7 දක්වා වැඩිවීමයි. II (ඒ) 14 (I) වැනි සංඛ්‍යා සටහනෙහි කොළඹ වෙළඳ පළ මිල හැසිරීම දක්වා ඇත.

ඵලදයි නොවූ තේ හා රබර් ඉඩම්වල අනිකුත් භෝග වගාකිරීම අරමුණු කොට තේ හා රබර් සහනාධාර පණත යටතේ භෝග විවිධාංග කිරීමේ සහනාධාර ක්‍රමයක් 1970 ජූනි මාසයේදී හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ ඵලදායි නොවූ තේ හා රබර් ඉඩම්වල නියම කරන ලද අවම අක්කර ප්‍රමාණයක පොල්, කොකෝ, තෘණ, දුව, කරදමුංගු, ගම්මිරිස්, සාදික්කා, කරාබු, පැෂන් ෆෲට්, අන්නාසි, දුම්කොල සහ තෙල් සඳහා තල් වවන අයට අක්කරයකට වෙනස් වූ අනුපාතයකින් සහනාධාර[1] සැපයීමට නියමිත විය. මෙම සහනාධාර වගාකරුවාට කොටස් ලෙස සපයනු ලබන සෘජු දීමනා ස්වරූපයක් ගනී. වියදම් සඳහා මීට අමතර සහන ස්වරූපයෙන් ලංකා රාජ්‍ය උකස් බැංකුවෙන් ණය ගැනීමේ ක්‍රමයක් ද පවත්වාගෙන යනු ලැබේ.

## II (ඒ) 14 II වැනි සංඛ්‍යා සටහන

| භෝගය | අක්කරයට සහනාධාර (කොටස් වශයෙන්) | වගාව සඳහා අනුමැතියට නියමිත අවම අක්කර ගණන | සාමාන්‍යයෙන් යෝග්‍ය දිස්ත්‍රික්ක |
|---|---|---|---|
| පොල් .. | රු. 800/- | අක්කර 1 | කොළඹ, නුවර, මාතලේ, ගාල්ල, කුරුණෑගල, මාතර, රත්නපුරය, කෑගල්ල, බදුල්ල, මොනරාගල |
| කොකෝවා .. | රු. 1,200/- | අක්කර 1 | නුවර, මාතලේ, කුරුණෑගල, මොනරාගල, කෑගල්ල, බදුල්ල |
| තෘණ .. | රු. 500/- | අක්කර 2 | කොළඹ, නුවර, නුවරඑළිය, කුරුණෑගල, බදුල්ල, |
| දුව . | රු. 600/- | අක්කර 5 | රත්නපුරය, කොළඹ, කෑගල්ල, නුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල |
| කරදමුංගු, ගම්මිරිස් .. | රු 900 /- බැගින් | අක්කර ½ | පස හා දේශගුණය අනුව සලකා බැලීමට නියමිතයි. (නුවර, මාතලේ, රත්නපුරය, නුවරඑළිය හා කුරුණෑගල) |
| සාදික්කා හා කරාබු .. | රු. 800/- බැගින් | අක්කර ¼ | |
| පැෂන්ෆෲට් හා අන්නාසි .. | රු. 1,000/- බැගින් | | |
| තෙල් සඳහා තල් .. | රු. 1,500/- බැගින් | | මාතලේ, නුවර, දුම්බර මිටියාවත, |
| දුම්කොල .. | රු. 500/- | | නුවරඑළිය බදුල්ල හා මොනරාගල. |
| අනුමත කළ වෙනත් භෝගයන් .. | රු. 500/- | | |

මූලය: තේ හා රබර් පාලක දෙපාර්තමේන්තුව.

1. ඵලදයි නොවූ තේ හා රබර් ඉඩම්වල භෝග විවිධාංගකරණය සඳහා දෙනු ලබන සහනාධාර ක්‍රමය පිළිබඳ විස්තර කොරතුරු II (ඒ) 14 (II) සටහනෙහි දක්වා ඇත.

**(ඇ) ආනයන**[1]

ඉහතින් දැක්වූ පරිදි, 1970 වර්ෂයේ (රේගු සංඛ්‍යා) ආනයන වටිනාකම රු. දශලක්ෂ 230 කින් තියුණු ලෙස පහළ යෑම, වටිනාකම වැඩියෙන් දක්වා ඇති, ආහාර කොමසාරිස් වරයාගේ ආනයන සමග ගැලපූ විට, රු. දශලක්ෂ 204 දක්වා අඩුවෙයි.

II (ඒ) 15 සංඛ්‍යා සටහනින්, රේගු සංඛ්‍යා ආහාර කොමසාරිස් වරයාගේ සහල් පිටි සහ සීනි තථ්‍ය ආනයන සමග ගැලපීමෙන් පසු සත්‍ය තත්ත්වය දක්වයි.

## II (ඒ) 15 වැනි සංඛ්‍යා සටහන

### ආහාර කොමසාරිස් වරයාගේ ආනයන සමඟ ගලපන ලද රේගු සංඛ්‍යා

| | වටිනාකම රුපියල් දශ ලක්ෂ | |
|---|---|---|
| | 1969 | 1970 |
| 1· පාරිභෝගික භාණ්ඩ එයින් .. .. | 1,174 | 1,276 |
| (අ) ආහාර පාන .. .. | 932 | 1,051 |
| (i) සහල් .. .. | 211 | 353 |
| (ii) පිටි .. .. | 230 | 225 |
| (iii) සීනි, ශුද්ධ කළ .. .. | 142 | 152 |
| (ආ) රෙදිපිළි .. .. | 122 | 124 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ .. | 120 | 101 |
| 2· අන්තර් භාණ්ඩ .. .. .. | 592 | 451 |
| 3· ආයෝජන භාණ්ඩ .. .. .. | 700 | 546 |
| 4· වර්ග නොකළ ආනයන .. .. | 33 | 27 |
| 5· මුළු ආනයන .. .. .. | 2,499 | 2,295 |

1970 වර්ෂයේ ආහාර කොමසාරිස් වරයාගේ සහල්, පිටි සහ සීනි ආනයනවල මුළු වටිනාකම තියුණු ලෙස වැඩිවෙමින් රුපියල් දශලක්ෂ 730 ක් වූයෙන්, එහි ප්‍රතිඵලයක් වශයෙන් 1969 වර්ෂයේ එම ආනයන වටිනාකම හා සසඳන විට විදේශ විනිමය වැයවීම රුපියල් දශලක්ෂ 147 කින් වැඩිවිය. එනම්, ඔහුගේ සහල් ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 353 ක් සහ සීනි ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 152 ක් වූයෙන් ඉකුත් වර්ෂයේ මෙම ආනයන වටිනාකම් හා සසඳන විට පිළිවෙලින් රුපියල් දශලක්ෂ 142 කින් හා රුපියල් දශලක්ෂ 10 කින් ඉහළ ගිය අතර, පිටි ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 225 ක් වූයෙන් රුපියල් දශලක්ෂ 5 ක අඩුවීමක් දැක්විය.

II (ඒ) 16 වැනි සංඛ්‍යා සටහනින් ආහාර කොමසාරිස් වරයා විසින් සහ රේගුව විසින් වාර්තා කර ඇති 1969 සහ 1970 වර්ෂවලදී ආනයනය කරන ලද සහල්, පිටි සහ සීනිවල පරිමා, වටිනාකම් සහ මි. ගැ. මිල දක්වයි.

---

1. 1969 ජනවාරි සිට ආනයන සංඛ්‍යා බ්‍ර. තී. නා. අනුව වර්ග කොට ඇත. කෙසේ හෝ ඉකුත් වර්ෂවල සංඛ්‍යා සමග සැසැඳීමේ පහසුව සඳහා බ්‍ර. තී. නා. අනුව වූ සංඛ්‍යා සම්මත ජාත්‍යන්තර වර්ගීකරණ අනුව වූ අනුරූප සංඛ්‍යා සමග ගැලපීම සඳහා නැවත වර්ග කොට ඇත. වැරදි ඇතොත් සුළු වශයෙනි.

## II (ඒ) 16 සංඛ්‍යා සටහන

### සහල්, තිරිඟු පිටි සහ සීනි ද්‍රව්‍යයන්ගේ රේගු සංඛ්‍යා සහ නියම ආනයන සංඛ්‍යා

| | ආහාර කොමසාරිස්වරයාගේ සංඛ්‍යා | | | | රේගු සංඛ්‍යා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | වෙනස | | | | වෙනස | |
| | 1969 | 1970 | නියම | % | 1969 | 1970 | නියම | % |
| **සහල්** | | | | | | | | |
| | 260 | | | | | | | |
| ප්‍රමාණය ටොන් දහස් .. | 211 | 526 | +266 | + 102·3 | 304 | 472 | +168 | +55·3 |
| වටිනාකම රුපියල් දශලක්ෂ .. | 811·18 | 353 | +142 | + 67·3 | 257 | 318 | + 61 | +23·7 |
| මී. ගැ. මිළ ටොන් එක රුපි: .. | | 671·15 | —140·03 | — 17·3 | 846·51 | 672·70 | —173·81 | —20·5 |
| **පිටි** | | | | | | | | |
| | 388 | | | | | | | |
| ප්‍රමාණය ටොන් දහස් .. | 230 | 369 | —19 | — 4·9 | 409 | 419· | + 10 | + 2·4 |
| වටිනාකම රුපියල් දශලක්ෂ .. | 591·94 | 225 | —5 | – 2·2 | 255 | 260 | + 5 | + 2·0 |
| මී. ගැ. මිළ ටොන් එක රුපි: .. | | 611·44 | + 19·50 | + 3·3 | 624·38 | 621·48 | — 2·90 | — 0·5 |
| **සීනි** | | | | | | | | |
| | 308 | | | | | | | |
| ප්‍රමාණය ටොන් දහස් .. | 142 | 240 | —68 | — 22·1 | 265 | 279 | + 14 | +5·3 |
| වටිනාකම රුපියල් දශලක්ෂ .. | 459·93 | 152 | +10 | — 7·0 | 115 | 170 | + 55 | +47·8 |
| මී. ගැ. මිළ ටොන් එක රුපි: .. | | 633·71 | +173·78 | + 37·8 | 436·02 | 608·46 | +172·44 | +39·5 |
| සහල්, පිටි සහ සීනි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ .. | 583 | 730 | +147 | + 25·2 | 627 | 748 | +121 | +19·3 |

මූලයන්: ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුව
ලංකා රේගු වාර්තා

**සහල්**

1970 වර්ෂයේ සහල් ආනයන වටිනාකම තියුණු ලෙස වැඩිවීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශ විනිමය වැය වැඩිවීම එකහෙලාම ආනයන පරිමාව ටොන් 266 කින් හෙවත් සියයට 102 කින් වැඩිවීමෙහි ප්‍රතිඵලය වූ අතර, එහි බලපෑම සාමාන්‍ය මී. ගැ. මිල ටොන් එකක් රුපියල් 140 කින් අඩුවීම මගින් තරමක් දුරට කපා හැරියේය. සමාලෝචනයට භාජනය වී ඇති වර්ෂයේ සහල් ආනයන පරිමාව දෙගුණ වීමට ප්‍රධාන හේතුව වූයේ, පාරිභෝගිකයින් සඳහා සතිපතා නිකුත්කරන ලද සහනදායි සලාකය සේරු දෙකක් කිරීමට රජය තීරණය කිරීම විය. සාමාන්‍ය මී. ගැ. මිල අඩුවීමට හේතු වූයේ සහල් නිෂ්පාදනය කරනු ලබන රටවල් බොහොමයක යහපත් අස්වැන්නක් ලැබීම හා ඒ මගින් නිෂ්පාදිතය වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තර වෙළඳ පලේ සහල් මිල පහත් මට්ටමක පැවතීම අනුගමනය කිරීම නිසාය.

**පිටි**

ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 5 කින් අඩුවීමට හේතු වූයේ, ආනයන පරිමාව ටොන් 19 දහසකින් හෙවත් සියයට 5 කින් අඩුවීම වූ අතර, එහි බලපෑම සාමාන්‍ය මී.ගැ. මිල ටොන් එක රු. 20.00 කින් වැඩිවීම මගින් තරමක් දුරට කපා හැරියේය. තිරිඟු පිටි සාමාන්‍ය මී. ගැ. මිල වැඩිවීමට හේතු වූයේ පිටි නිෂ්පාදන රටවල් බොහොමයක නිෂ්පාදිතය පහල යෑම සහ නැව් ගාස්තු වැඩිවීමත් නිසාය.

**සීනි**

1970 වර්ෂයේ සීනි ආනයන වටිනාකම 1969 වර්ෂයේ එම වටිනාකම හා සසඳන විට රුපියල් දශලක්ෂ 10 කින් වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ සාමාන්‍ය මි. ගැ. මිල ටොන් එකක් රු. 174 කින් හෙවත් සියයට 38 කින් ඉහළ යාමයි. කෙසේ හෝ ආනයන පරිමාව ටොන් 68 දහසකින් අඩුවිය. ජාත්‍යන්තර සීනි සම්මුතිය යටතේ අපනයන කොටස් අඩුවීම හා අපනයන කොටස්වල හිඟයෙන් නැවත බෙදහැරීම ප්‍රමාදවීම හේතුකොට ජාත්‍යන්තර වෙළඳ පලේ උසස් මිලක් පැවතීමේ ප්‍රතිඵලයක් වශයෙන් සාමාන්‍ය මි. ගැ. මිල වැඩිවිය.

II (ඒ) 17 වැනි සංඛ්‍යා සටහනින් රේගු වාර්තාවලින් පිළිබිඹු වන පරිදි ප්‍රධාන වර්ග සහ ද්‍රව්‍ය හෝ ද්‍රව්‍ය ගණ අනුව ආනයනයන් වර්ගකොට දක්වයි.

1970 වර්ෂයේ (රේගු සංඛ්‍යා) ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 230 කින් අඩුවීම, ''අන්තර් භාණ්ඩ'' හා ''ආයෝජන භාණ්ඩ'' ගණ කෙරෙහි බෙදී ගිය අතර, ''පාරිභෝජන භාණ්ඩ'' ආනයන වැඩිවීමක් වාර්තා කළේය. ප්‍රධාන භාණ්ඩ ගණ තුනෙහි කැපී පෙනෙන වෙනස්කම් මෙසේය:-

**පාරිභෝජන භාණ්ඩ**

''පාරිභෝජන භාණ්ඩ'' ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 76 කින් ඉහළ යාම ''ආහාර පාන'' සහ ''රෙදි පිළි'' උප ගණ කෙරෙහි බෙදී ගිය අතර, ''අනෙකුත් පාරිභෝජන භාණ්ඩ'' රුපියල් දශලක්ෂ 19 කින් අඩුවිය. 1970 වර්ෂයේ ''ආහාර පාන'' භාණ්ඩ ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 1,069 ක් වූයෙන් රුපියල් දශලක්ෂ 93 ක ඉහළ යාමක් පෙන්නුම් කළේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රේගු සටහන් අනුව සහල්, පිටි සහ සීනි ආනයන මුළු වටිනාකමෙහි රුපියල් දශලක්ෂ 121 ක වැඩිවීමක් දක්වීම විය. ''කිරි සහ කිරි නිෂ්පාදිත'' සඳහා වූ ආනයන වියදම් ද රුපියල් දශලක්ෂ 3 කින් ඉහළ ගියේය. ඉකුත් වර්ෂය හා සසඳන විට ''රෙදි පිළි'' ආනයන වටිනාකම ද රුපියල් දශලක්ෂ 2 ක සුළු වැඩිවීමක් දක්විය.

**අන්තර් භාණ්ඩ**

''අන්තර් භාණ්ඩ'' ගණයේ 'ඛනිජ තෙල් නිෂ්පාදිත' ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 58 ක් වූ අතර, 1969 වර්ෂයේ, එම වටිනාකම හා සසඳන විට රුපියල් දශලක්ෂ 98 කින් තියුණු ලෙස අඩුවීමක් දක්විය. වටිනාකමෙහි අඩුවීමට ඒකහෙලාම හේතුව වූයේ ආනයන පරිමාව ගැලුම් 261 කින් තියුණු ලෙස අඩුවීම වූ අතර,[1]/ සාමාන්‍ය මි. ර. ගැ. මිල ගැලුමක් ශත 18 කින් වැඩිවීම මගින් එහි බලපෑම තරමක් දුරට කපා හැරියේය. 1970 ආනයනය කරන ලද ඛනිජ තෙල් ප්‍රමාණය ගැලුම් දශලක්ෂ 96 ක් වූ අතර, ඒවායේ සාමාන්‍ය මි. ර. ගැ. මිල ගැලුමක් ශත 61 ක් විය. මෙම ආනයන වලින් වැඩි කොටසක්, ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ පිරිපහදු යන්ත්‍රාගාරයේ පිරිසිදු කිරීම් වස් ආනයනය කරනු ලැබූ අමු තෙල් වූ නිසාත්, 1969 ආනයනවලින් විශාල තොගයක් කොළඹ වරායේ පැවති නිසාත්, ආනයන පරිමාව අඩුවීමට හේතු වූවා විය හැකිය. 1969 වෙළඳ මිලට වඩා වැඩි මිලක් පැවති මැද පෙරදිග රටවලින් වැඩියෙන් මිලට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සාමාන්‍ය මි. ර. ගැ. මිල වැඩිවිය. 1970 වර්ෂයේ ''රසායනික ද්‍රව්‍ය සහ සංයෝග'' සහ ''කඩදාසි සහ ඝන කඩදාසි'' ආනයන වියදම රුපියල් දශලක්ෂ 10 බැගින් ඉහළ ගිය අතර, ''කැටි නූල් සහ නූල් කෙඳි'' සඳහා ආනයන වියදම රුපියල් දශලක්ෂ 39 කින් තියුණු ලෙස අඩුවිය. කෙසේ හෝ, 1970 දී

---

1. තෙල් සමාගම් මගින් ආනයනය කරන ලද බන්කර් සහ ඉන්ධන තෙල් වර්ග රේගු සංඛ්‍යාවට ඇතුළත්වන නිසා ඛනිජ තෙල් සංස්ථාව විසින් සපයා ඇති සංඛ්‍යාවලට රේගු සංඛ්‍යා වෙනස්වෙයි. 1970 වර්ෂයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශුද්ධ කළ ඛනිජ තෙල් ආනයනය කර නැත. ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් පිරිපහදු යන්ත්‍රාගාරයේ පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය අමු තෙල් 1969 දී ආනයන කරන ලදුව, කොළඹ වරායේ පැවති තොගවලින් ලබාගන්නා ලදී.

## ආනයන—ප්‍රධාන භාණ්ඩ වර්ග සහ භාණ්ඩ

| | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | |
|---|---|---|---|
| | 1966 | 1967 | 1968 |
| 1. පාරිභෝගික භාණ්ඩ .. .. .. | 1,161 | 931 | 1,147 |
| එයින් | | | |
| (අ) ආහාර පාන .. .. .. | 956 | 783 | 989 |
| (1) සහල් .. .. | 367 | 211 | 341 |
| (2) තිරිඟු පිටි .. .. | 113 | 229 | 250 |
| (3) (අ) සීනි (සුදු) .. .. | 103 | 74 | 97 |
| (ආ) සීනි, අනෙකුත්—සක්කරා හකුරු සහ සුකිරි .. .. | 2 | ... | ... |
| (4) කිරි සහ කිරි නිෂ්පාදිත .. .. | 77 | 66 | 74 |
| (5) මස්, මාළු සහ බිත්තර .. .. | 101 | 56 | 70 |
| එයින්, (අ) කරවල (උම්බලකඩ හැර එහෙත් වියලි ඉස්සන් ඇතුළුව) .. | 75 | 44 | 58 |
| (ආ) අනෙකුත් මාළු .. | 19 | 9 | 11 |
| (ඇ) මස් සහ පිළියෙල කළ මස් .. | 4 | 3 | 1 |
| (ඈ) බිත්තර .. .. | — | — | — |
| (6) අනෙකුත් ආහාර .. .. | 170 | 126 | 125 |
| එයින් (අ) අර්තාපල් .. .. | 24 | 7 | ... |
| (ආ) කඩල සහ ඇට වර්ග .. | 64 | 53 | 56 |
| (ඇ) ළූණු .. .. | 20 | 19 | 17 |
| (ඈ) මිරිස් .. .. | 43 | 29 | 34 |
| (7) බීම සහ සකස්කළ දුම්කොළ .. | 2 | 2 | 2 |
| (ආ) රෙදිපිළි (ඇඳුම් ඇතුළුව) .. .. | 119 | 73 | 77 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ .. .. | 86 | 75 | 81 |
| එයින් | | | |
| (1) මෝටර් රථ .. .. | 3 | 10 | 7 |
| (2) ඔරලෝසු සහ අත් ඔරලෝසු .. | ... | ... | ... |
| (3) ගුවන් විදුලි යන්ත්‍ර .. .. | ... | ... | 3 |
| (4) රබර් ටයර් සහ ටියුබ් .. .. | 5 | 4 | 3 |
| (5) ඖෂධ සහ ඖෂධීය සංයෝග .. | 35 | 22 | 23 |
| 2. අන්තර් භාණ්ඩ | 470 | 441 | 629 |
| එයින් | | | |
| (1) පොහොර .. .. | 91 | 80 | 110 |
| (2) ඛනිජ තෙල් නිෂ්පාදිත .. .. | 130 | 112 | 196 |
| (3) ගල් අඟුරු .. .. | 3 | 9 | 4 |
| (4) රසායනික ද්‍රව්‍ය සහ සංයෝග .. | 36 | 38 | 45 |
| (5) ඩයි වර්ග පදම් කිරීමේ සහ වර්ණ ද්‍රව්‍ය .. | 13 | 10 | 15 |
| (6) තේ සහ අනෙකුත් ලී පෙට්ටි .. | 18 | 9 | 10 |
| (7) කඩදාසි සහ කඩදාසි බෝඩ .. .. | 50 | 41 | 37 |
| (8) කැට් නූල් සහ නූල් .. .. | 42 | 45 | 71 |
| (9) සකස් නොකළ දුම්කොළ .. | 8 | 6 | 10 |
| 3. ආයෝජන භාණ්ඩ | 361 | 330 | 383 |
| එයින් | | | |
| (1) ගොඩනැගිලි උපකරණ .. .. | 70 | 48 | 95 |
| එයින් (අ) සිමෙන්ති .. .. | 20 | 9 | 17 |
| (2) ගමනාගමන උපකරණ .. .. | 116 | 89 | 80 |
| (3) යන්ත්‍රෝපකරණ .. .. | 162 | 175 | 195 |
| 4. එකතුව (1, 2 සහ 3 ශීර්ෂවල) .. .. | 1,992 | 1,702 | 2,159 |
| 5. වර්ග නොකළ ආනයන .. .. | 36 | 36 | 14 |
| 6. මුළු ආනයන .. .. .. | 2,028 | 1,738 | 2,173 |

II (ඒ) 17 වැනි සංඛ්‍යා සටහන

හෝ භාණ්ඩ ගණ අනුව—1966 - 70

| | | මුළු ආනයනවලින් සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|
| 1969 | 1970 | 1966 | 1967 | 1968 | 1969 | 1970 |
| 1,218 | 1,294 | 57·2 | 53·6 | 52·8 | 47·9 | 55·9 |
| 976 | 2,069 | 47·1 | 45·1 | 45·5 | 38·0 | 46·2 |
| 257 | 318 | 18·1 | 12·1 | 15·7 | 10·1 | 13·7 |
| 255 | 260 | 5·6 | 13·2 | 11·5 | 10·0 | 11·2 |
| 115 | 170 | 5·1 | 4·3 | 4·5 | 4·5 | 7·3 |
| ... | 1 | 0·1 | ... | ... | ... | ... |
| 52 | 55 | 3·8 | 3·8 | 3·4 | 2·0 | 2·4 |
| 87 | 68 | 5·0 | 3·2 | 3·2 | 3·4 | 2·9 |
| 69 | 53 | 3·7 | 2·5 | 2·7 | 2·7 | 2·3 |
| 17 | 15 | 0·9 | 0·5 | 0·5 | 0·7 | 0·6 |
| 1 | ... | 0·2 | 0·2 | ... | ... | ... |
| — | — | — | — | — | — | — |
| 145 | 139 | 8·4 | 7·2 | 5·8 | 5·7 | 6·0 |
| — | ... | 1·2 | 0·4 | ... | — | ... |
| 78 | 63 | 3·1 | 3·0 | 2·6 | 3·1 | 2·7 |
| 17 | 29 | 1·0 | 1·1 | 0·8 | 0·7 | 1·3 |
| 26 | 26 | 2·0 | 1·7 | 1·6 | 1·0 | 1·1 |
| 4 | 3 | 0·1 | 0·1 | 0·1 | 0·2 | 0·1 |
| 122 | 124 | 5·9 | 4·2 | 3·5 | 4·8 | 5·3 |
| 120 | 101 | 4·2 | 4·3 | 3·7 | 4·7 | 4·4 |
| 13 | 10 | 0·1 | 0·6 | 0·3 | 0·5 | 0·4 |
| ... | ... | ... | ... | ... | ... | ... |
| 1 | 1 | 0·1 | ... | 0·1 | ... | ... |
| 22 | 11 | 0·2 | 0·2 | 0·1 | 0·9 | 0·5 |
| 32 | 29 | 1·7 | 1·3 | 1·1 | 1·3 | 1·3 |
| 592 | 451 | 23·2 | 25·4 | 29·0 | 23·3 | 19·5 |
| 66 | 81 | 4·5 | 4·6 | 5·1 | 2·6 | 3·5 |
| 156 | 58 | 6·4 | 6·4 | 9·0 | 6·1 | 2·5 |
| 4 | 4 | 0·1 | 0·5 | 0·1 | 0·2 | 0·2 |
| 66 | 56 | 1·8 | 2·2 | 2·1 | 2·6 | 2·4 |
| 14 | 10 | 0·6 | 0·6 | 0·7 | 0·6 | 0·4 |
| 13 | 9 | 0·9 | 0·6 | 0·5 | 0·5 | 0·4 |
| 55 | 45 | 2·5 | 2·4 | 1·7 | 2·2 | 1·9 |
| 80 | 41 | 2·1 | 2·6 | 3·3 | 3·1 | 1·8 |
| 6 | 3 | 0·4 | 0·3 | 0·5 | 0·2 | 0·1 |
| 700 | 546 | 17·8 | 19·0 | 17·6 | 27·5 | 23·6 |
| 99 | 119 | 3·4 | 2·8 | 4·5 | 3·9 | 5·1 |
| 14 | 7 | 1·0 | 0·5 | 0·8 | 0·6 | 0·3 |
| 213 | 126 | 5·7 | 5·1 | 3·7 | 8·4 | 5·4 |
| 368 | 276 | 8·0 | 10·1 | 9·0 | 14·5 | 11·9 |
| 2,510 | 2,291 | 98·2 | 97·9 | 99·4 | 98·7 | 99·0 |
| 33 | 22 | 1·8 | 2·1 | 0·6 | 1·3 | 1·0 |
| 2,543 | 2,313 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100 0 |

මූලය: ලංකා මර්ගු වාර්තා

"පොහොර ආනයන සඳහා වැය කිරීම 1969 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 15 කින් ඉහළ යාමක් පෙන්නුම් කළේය. මෙම ආනයන වටිනාකම වැඩිවීමට හේතු වූයේ ආනයන පරිමාව ටොන් 45 දහසකින් ප්‍රසාරණය වීම හා සාමාන්‍ය මී. ර. ගැ. මිල ටොන් එක රුපියල් 8 කින් ඉහළ යාම නිසාත්ය.

ආයෝජන භාණ්ඩ

මෙම ගණයේ ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 154 කින් අඩුවීම, "ගමනාගමන" උපකරණ සහ "යන්ත්‍ර සූත්‍ර උපකරණ" උප ගණවල වටිනාකම් කෙරෙහි බෙදී ගියේය. කෙසේ හෝ "ගොඩනැගිලි උපකරණ" ආනයන වටිනාකමෙහි වැඩිවීමක් වාර්තා කළේය. "ගමනාගමන උපකරණ" ගණයේ 1969 ආනයන අසාමාන්‍ය ලෙස වැඩිවීමට හේතු වූයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඩීසල් කිරීමේ වැඩ සටහන නිසාත්, ලංකා ගුවන් සේවය සඳහා (ට්‍රයිඩන්ට්) ගුවන් යානයක් ගෙන්වීම සහ ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා බස් රථ ගෙන්වීමත් නිසාය.

(ඇ) කොළඹ වරායේ වෙනස්වීම්

1970 දී කොළඹ වරායේදී හසුරුවන ලද නැව් බඩු ප්‍රමාණය ටොන් 27,68,929ක් වූයෙන්, 1969 වර්ෂය හා සසඳන විට ටොන් 2,57,272 ක තියුණු අඩුවීමක් පෙන්නුම් කළේය. හසුරුවන ලද නැව් බඩු ප්‍රමාණය මෙසේ අඩුවීමට හේතු වූයේ 1970 වර්ෂය තුළදී ආනයන කළ ප්‍රමාණය අඩුවීමත්, වර්ෂයේ පළමු කාර්තුවේ පැවති වැඩ වර්ජන නිසාත්, වර්ෂයේ දෙවැනි සහ තුන්වැනි කාර්තුවලදී පැවති වර්ෂාව නිසා වරායේ වැඩට බාධාවීමත් නිසාය. 1969 වර්ෂය හා සසඳන විට මෙහෙයවූ අපනයන නැව් බඩු ප්‍රමාණය ටොන් 35,016 කින් අඩුවූ අතර, ආනයන නැව් බඩු ප්‍රමාණය ඊට තියුණු ලෙස ටොන් 2,22,256 කින් අඩුවීය.

කොළඹ වරායේදී, 1970 වර්ෂයේ එක් එක් කාර්තුවේදී මෙහෙයවූ නැව් බඩු ප්‍රමාණය 1969 අනුරූප සංඛ්‍යා සමග II (ඒ) 18 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙයි.

II (ඒ) 18 වැනි සංඛ්‍යා සටහන

කොළඹ වරායේදී මෙහෙය වූ ආනයන සහ අපනයන නැව් බඩු

(නැව් ටොන්)

| | 1969 | 1970 | වෙනස: නිරපේක්ෂ | වෙනස: % |
|---|---|---|---|---|
| පළමු කාර්තුව .. .. | 861,560 | 756,007 | – 105,553 | – 12·3 |
| දෙවැනි කාර්තුව .. .. | 780,538 | 673,648 | – 106,890 | – 13·7 |
| තුන්වැනි කාර්තුව .. .. | 763,337 | 648,722 | – 114,615 | – 15·0 |
| හතරවැනි කාර්තුව .. .. | 620,766 | 690,552 | + 69,786 | + 11·2 |
| වර්ෂය .. .. | 3,026,201 | 2,768,929 | – 257,272 | – 8·5 |

මූලය: වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය

1967 ජූනි මාසයේ සූවස් ඇල වැසීම නිසාත්, 1967 නොවැම්බර් මාසයේ ස්ටර්ලින් පවුම අවප්‍රමාණ කිරීම නිසාත්, ඇතිකරන ලද අධි නැව් ගාස්තු පිළිබඳ විස්තරයක් 1967 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවෙහි සඳහන්කොට ඇත.[1] මෙම අධි ගාස්තු 1969 වර්ෂය තුළදී ද, මූලික නැව් ගාස්තු වල යම් යම් වෙනස්කම් සහිතව ක්‍රියාත්මකව පැවතුනි.[2] 1970 වර්ෂයේ නැව් ගාස්තු පොදු වශයෙන් සියයට 5 සිට 12½ දක්වා ඉහළ දමන ලදී.

1· ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 1967, පිටුව 144
2· ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 1969, පිටු 243 සහ 244

1970 වර්ෂයේදී පොදුවේ වැඩිකරන ලද නැව් ගාස්තුවල විස්තරයක් පහත දක්වෙයි[1].

(i) ලංකා/අමෙරිකා නැව් සමාගම

1970-1-1 – අමෙරිකා සහ අත්ලන්තික් වරායවලට සියයට 5 ක පොදු නැව් ගාස්තු වැඩිකිරීමක්.

(ii) ලංකා/ඕස්ට්‍රේලියා නැව් සමාගම

1970-3-1 – ඕස්ට්‍රේලියානු වරායවලට සියයට 7 ක පොදු නැව් ගාස්තු වැඩි කිරීමක්.

(iii) ලංකා/නවසීලන්ත නැව් සමාගම

1970-4-1 – නවසීලන්ත වරායවලට සියයට 7½ ක පොදු නැව් ගාස්තු වැඩිකිරීමක්.

(iv) සීමාසහිත එලර්මන් සහ බක්නෝල් ස්ටීම්ෂිප් සමාගම

1970-4-1 – කැනඩා සහ අත්ලන්තික් වරායවලට සියයට 5 ක පොදු නැව් ගාස්තු වැඩිකිරීමක්.

(v) ලංකා/එක්සත් රාජධානිය සහ මහාද්වීපික නැව් සමාගම්

1970-9-1 – එක්සත් රාජධානි, මහාද්වීප සහ මධ්‍යධරණී වරායවලට සියයට 12½ ක නැව් ගාස්තු වැඩිකිරීමක්. කෙසේ හෝ තේ සඳහා නැව් ගාස්තු වැඩිකිරීම සියයට 7½ කට සීමාකරන ලදී. කොළඹ සහ කල්කටාව අතර නැව් ගාස්තුවල වෙනස්කම් අඩුකිරීම පිළිබඳව 1969 දී සඳහන් කර ඇත. ඉහතින් දක්වා ඇති මඳ වශයෙන් වැඩි කිරීම් නිසා දිගු කාලයක සිට වරායයන් දෙක අතර, තේ සඳහා පැවති නැව් ගාස්තු වෙනස්කම තවත් සියයට 5 කින් තුනීවිය.

(ඉ) වෙළෙඳ රටාව

ප්‍රධාන මූල්‍ය කලාප හා ප්‍රදේශවලට 1970 වර්ෂයේදී ලංකාවෙන් කරනලද අපනයන විවිධ අන්දමට වැඩිවූ බව දක්විය. ආසියානු හා ඈත පෙරදිග ආර්ථික කොමිෂන් කලාපය හැර අනෙකුත් කලාප හා ප්‍රදේශවලින් ගෙන්වන ලද ආනයන වටිනාකම්වල අඩුවීම් වාර්තා විය II (ඒ) 19 සංඛ්‍යා සටහනින් ප්‍රධාන මූල්‍ය කලාප හා ප්‍රදේශ සමග පැවති වෙළෙඳ රටාව දක්වයි.

---

1· ලංකා නැව් සංගමය මගින් සපයන ලද විස්තරය අනුව.

## II (ඒ) 19 වැනි සංඛ්‍යා සටහන

### මූල්‍ය ප්‍රදේශ හා කලාප අනුව ලංකාවේ ජාත්‍යන්තර (භාණ්ඩ) වෙළෙඳාම

රුපියල් දශ ලක්ෂ

| | මුළු අපනයන නැ. වි. ස. (අ) | | මුළු ආනයන මි. ර. ගැ. | | වෙළෙඳ ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | 1969 | 1970 | 1969 | 1970 (ආ) | 1969 | 1970 |
| ස්ටර්ලින් කලාපය .. | 745·5 | 850·9 | 974·2 | 944·9 | – 228·7 | – 94·0 |
| ඩොලර් කලාපය .. | 202·0 | 211·0 | 247·2 | 200·2 | – 45·2 | + 10·8 |
| අනෙකුත් .. | 934·9 | 940·9 | 1322·0 | 1162·3 | – 387·1 | – 222·3 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් .. | 695·3 | 767·8 | 997·4 | 918·5 | – 302·1 | – 150·7 |
| විදේශීය රටවල් (ඇ) .. | 1187·1 | 1235·0 | 1546·0 | 1389·9 | – 358·9 | – 154·9 |
| යුරෝපා ආර්ථික හවුල (ඈ) .. | 174·1 | 198·8 | 325·2 | 283·7 | – 151·1 | – 84·9 |
| යුරෝපා නිදහස් වෙළඳ සංගමය (ඉ) .. | 391·1 | 470·4 | 486·9 | 369·6 | – 95·8 | + 100·8 |
| ආ· ඇ· පෙ· ආ· කො· කලාපය (ඊ) .. | 520·6 | 541·9 | 1005·4 | 1104·8 | – 484·8 | – 562·9 |

මූලය: ලංකා රේගු වාර්තා

(අ) බන්කර සහ නැව් ගබඩා තොග ඇතුළත් නැත.

(ආ) ගමන් බඩු ඇතුළත් නොවේ.

(ඇ) 1965 සංඛ්‍යාවන්ට දකුණු අප්‍රිකානු සංගමය සමග කළ වෙළෙඳාම ඇතුළත්ය.

(ඈ) බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ලැක්සැම්බර්ග් සහ නෙදර්ලන්තය.

(ඉ) ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය, නෝර්වේ, පෘතුගාලය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය සහ එක්සත් රාජධානිය.

(ඊ) ඇප්ගනිස්ථානය, ඕස්ට්‍රේලියාව (1964 සිට) බෲනි, බුරුමය, කාම්බෝජය, ලංකාව, මහජන චීන සමූහාණ්ඩුව, තායිවාන්, මැලේසියාව, (මලයාව, උතුරු බෝර්නියෝව, සරවක්) හොංකොං, ඉන්දියාව ඉන්දුනීසියාව, අයිරානය, ජපානය, උතුරු කොරියාව, දකුණු කොරියාව, ලාඕසය, මොන්ගෝලියාව, නේපාලය, නවසීලන්තය (1964 සිට) පකිස්ථානය, පිලිපීනය, සිංගප්පූරුව, බටහිර සැමෝවා (1964 සිට) තායිලන්තය, උතුරු වියට්නාමය හා දකුණු වියට්නාමය.

ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වෙන වෙනස්වීම් වලින් කැපී පෙනෙන කරුණු මෙසේය.

(අ) අපනයන වැඩිවීම් එක්සත් රාජධානිය රු. දශලක්ෂ 76, ජපානය රු. දශලක්ෂ 22, පෝලන්තය රු. දශලක්ෂ 14, මහජන චීන සමූහාණ්ඩුව රු. දශලක්ෂ 11, එක්සත් අරාබි සමූහාණ්ඩුව රු. දශලක්ෂ 10,

(ආ) ආනයන අඩුවීම් එක්සත් රාජධානිය රුපියල් දශලක්ෂ 113, ඇමරිකා එක්සත් ජනපදය රුපියල් දශ ලක්ෂ 81, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජය රුපියල් දශලක්ෂ 75 යුගෝස්ලේවියාව රුපියල් දශ ලක්ෂ 21, ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව රුපියල් දශලක්ෂ 20, පකිස්ථානය රුපියල් දශ ලක්ෂ 17, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව රුපියල් දශ ලක්ෂ 11 සහ ඉතාලිය රුපියල් දශ ලක්ෂ 10.

(ඇ) අපනයන අඩුවීම්-ඕස්ට්‍රේලියාව හා සෝවියට් රුසියාව රුපියල් දශලක්ෂ 7 බැගින්, අ. එ. ජ. සහ පකිස්ථානය රුපියල් දශලක්ෂ 6 බැගින්, ඉන්දියාව සහ දකුණු අප්‍රිකානු සංගමය රුපියල් දශ ලක්ෂ 4 බැගින්.

(ඈ) ආනයන වැඩිවීම්-බුරුමය රුපියල් දශලක්ෂ 59, කැනඩාව රුපියල් දශ ලක්ෂ 34, පෝලන්තය රුපියල් දශලක්ෂ 25, එක්සත් අරාබි සමූහාණ්ඩුව රුපියල් දශ ලක්ෂ 18, චෙකොස්ලොවැකියාව රුපියල් දශලක්ෂ 17, ජපානය රුපියල් දශ ලක්ෂ 8, ඉන්දියාව රුපියල් දශ ලක්ෂ 13, නවසීලන්තය රුපියල් දශ ලක්ෂ 12, ඕස්ට්‍රේලියාව රුපියල් දශලක්ෂ 8 සහ චීන මහජන සමූහාණ්ඩුව රුපියල් දශලක්ෂ 7.

**චීන මහජන සමූහාණ්ඩුව සමග වෙළෙඳාම.**

II (ඒ) 20 සංඛ්‍යා සටහනින් 1966-70 කාලච්ඡේදය තුළදී ලංකාව චීන මහජන සමූහාණ්ඩුවත් සමග පැවති වෙළෙඳාම් පිළිබඳ සංඛ්‍යා දක්වයි.

### II (ඒ) 20 වැනි සංඛ්‍යා සටහන

### චීන මහජන සමූහාණ්ඩුව සමග වෙළෙඳම - 1966-70

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය රු. දශලක්ෂ | වෙළෙඳ පිරිවැටුම | |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම රු: දශලක්ෂ | මුළු අපනයන වලින් සියයට ගණන | වටිනාකම රු. දශලක්ෂ | මුළු ආනයන වලින් සියයට ගණන | | වටිනාකම රු. දශලක්ෂ | මුළු වෙළෙඳ පිරිවැටුමින් සියයට ගණන |
| 1966 | 177 | 10·4 | 217 | 10·7 | — 40 | 394 | 10·6 |
| 1967 | 153 | 9·1 | 185 | 10·6 | — 32 | 338 | 9·9 |
| 1968 | 195 | 9·6 | 245 | 11·3 | — 50 | 440 | 10·5 |
| 1969 | 240 | 12·5 | 282 | 11·1 | — 42 | 522 | 11·7 |
| 1970 | 252 | 12·4 | 289 | 12·5 | — 37 | 541 | 12·4 |

මූලය: ලංකා රේගු වාර්තා.

1970 වර්ෂයේදී ලංකාව චීන මහජන සමූහාණ්ඩුවත් සමග කළ වෙළෙඳාමෙහි වෙළෙඳ පිරිවැටුම ප්‍රසාරණයක් දැක්වීය. ලංකාවෙන් චීනය වෙතවූ අපනයන සියයට 5 කින්, රුපියල් දශලක්ෂ 252 දක්වා ඉහළ ගිය අතර, ආනයන රුපියල් දශලක්ෂ 7 කින් හෙවත් සියයට 3 කින්, රුපියල් දශලක්ෂ 289 දක්වා ප්‍රසාරණය විය. 1969 වර්ෂයේ පැවති රුපියල් දශලක්ෂ 42 ක වෙළෙඳ හිඟය 1970 දී රුපියල් දශලක්ෂ 37 දක්වා අඩුවීය. ලංකාව චීන මහජන සමූහාණ්ඩුව හා සමග පැවති වෙළෙඳාමේ වෙළෙඳ පිරිවැටුම 1970 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 541 ක්වූ අතර, ලංකාවේ මුළු වෙළෙඳ පිරිවැටුමින් සියයට 12·4 ක් විය. 1969 වර්ෂයේ සංඛ්‍යා හා සසඳනවිට එය ආසන්න වශයෙන් සියයට 1 ක ප්‍රසාරණයක් පෙන්නුම් කළේය.

1969 සහ 1970 වර්ෂයන්හිදී මහජන චීන සමූහාණ්ඩුව හා ලංකාව අතර වූ වෙළෙඳ කටයුතු බෙදී ගිය අයුරු II (ඒ) 21 වැනි සංඛ්‍යා සටහන මගින් දක්වා ඇත.

### II (ඒ) 21 සංඛ්‍යා සටහන

### මහජන චීන සමූහාණ්ඩුව හා වෙළෙඳ කටයුතු - (භාණ්ඩ අනුව)

### 1969-70

රුපියල් දශලක්ෂ

| | 1969 | 1970 | නිරපේක්ෂ වෙනස |
|---|---|---|---|
| අපනයන | | | |
| රබර් .. .. | 213·0 | 230·5 | + 17·5 |
| පොල් තෙල් .. .. | 27·3 | 20·1 | — 7·2 |
| අනෙකුත් .. .. | — | 0·9 | + 0·9 |
| **එකතුව** .. .. | **240·3** | **251·5** | **+ 11·2** |
| ආනයන | | | |
| සහල් .. .. | 207·7 | 213·9 | + 6·2 |
| රෙදිපිළි .. .. | 32·4 | 47·7 | + 15·3 |
| වියළි මිරිස් .. .. | 13·0 | 9·0 | — 4·0 |
| රෙදි නූල් සහ නූල් .. .. | 4·9 | 0·2 | — 4·7 |
| ඇට වර්ග .. .. | 3·7 | 1·7 | — 2·0 |
| තේ පෙට්ටි .. .. | 1·1 | 1·0 | — 0·1 |
| අනෙකුත් .. .. | 19·1 | 15·8 | — 3·3 |
| **එකතුව** .. .. | **281·9** | **289·3** | **+ 7·4** |
| වෙළෙඳ ශේෂය .. .. | — 41·6 | — 37·8 | — |

මූලය: ලංකා රේගු වාර්තා.

1970 දී, ප්‍රධාන අපනයන භාණ්ඩය රබර්වූ අතර අපනයන වටිනාකම රුපියල් දශලක්ෂ 17·5 ක් හෙවත් සියයට 8 න් රුපියල් දශ ලක්ෂ 230·5 දක්වා ඉහළ ගියේය. මේ ඉහළ යාමට මුළුමනින්ම හේතු වූයේ අපනයනය කළ රබර් පරිමාව ප්‍රසාරණය වීමය. 1970 දී මුළු රබර් අපනයන පරිමාව රාත්තල් දශලක්ෂ 186·8 ක්වූ අතර 1969 දී රාත්තල් දශ ලක්ෂ 157·1 ක් විය. එය රාත්තල් දශලක්ෂ 29·7 ක වැඩිවීමකි. 1969 හා සැසැඳීමේදී, පොල්තෙල් අපනයන වටිනාකම රුපියල් දශලක්ෂ 7·2 කින් සංකෝචනය වූයේ පරිමාව සහ සාමාන්‍ය නෑ. වි. ස. මිල පහල වැටීමේ හේතුවෙනි. 1970 දී පොල් තෙල් අපනයන පරිමාව ටොන් 10·3 දහසක් වූ අතර (1969 ටොන් 13·7 දහස හා සැසැඳීමේදී) සාමාන්‍ය නෑ. වි. ස. මිල ටොන් එක රුපියල් 1961·60 ක් විය; 1969 අනුරූපී සාමාන්‍ය නෑ. වි. ස. මිල ටොන් එක රුපියල් 1991·80 ක් විය.

1970 දීද මහජන චීන සමූහාණ්ඩුවෙන් ආනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩය වූයේ සහල්ය. සහල් ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 213·9 ක්වූ අතර එය 1969 අනුරූපී වටිනාකමට වඩා රුපියල් දශලක්ෂ 6·2 කින් හෙවත් සියයට 3 කින් ඉහළ යාමකි. රෙදි පිළි ආනයනයන්හි වටිනාකම 1969 දී පැවති රුපියල් දශලක්ෂ 32·4 න් රුපියල් දශලක්ෂ 47·7 දක්වා සැලකිය යුතු අන්දමින් ඉහළ ගියේය. කෙසේ වුවද, වියළි මිරිස් ආනයනය 1969 දී පැවති රුපියල් දශලක්ෂ 13·0 න් රුපියල් දශලක්ෂ 9·0 දක්වා අඩු වූයේය.

**සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව හා නැගෙනහිර යුරෝපය**
**සමග වෙළෙඳ කටයුතු**

මෙම කලාපය හා ලංකාව අතරවූ වෙළෙඳ කටයුතු පිළිබඳ දත්ත II (ඒ) 22 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II (ඒ) 22 වැනි සංඛ්‍යා සටහන**

**සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව හා නැගෙනහිර යුරෝපය සමග වෙළෙඳ කටයුතු***

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය රුපියල් දශලක්ෂ | වෙළෙඳ පිරිවැටුම | |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු අපනයන වටිනාකම සියයට | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු ආනයන වටිනාකම සියයට | | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු වෙළෙඳ පිරිවැටුම සියයට |
| 1966 | 154 | 9·1 | 203 | 10·0 | – 49 | 357 | 9·6 |
| 1967 | 104 | 6·2 | 164 | 9·4 | – 60 | 268 | 7·8 |
| 1968 | 163 | 8·0 | 180 | 8·3 | – 17 | 343 | 8·0 |
| 1969 | 165 | 8·6 | 251 | 9·9 | – 86 | 416 | 12·0 |
| 1970 | 174 | 8·6 | 185 | 8·0 | – 11 | 359 | 8·2 |

මූලය: ලංකා රේගු වාර්තා

* බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හංගේරියාව, පෝලන්තය, රුමේනියාව සහ යුගෝස්ලාවියාව.

1970 දී සෝ. ස. ස. සංගමය, නැගෙනහිර යුරෝපය සහ ලංකා අතර වූ වෙළෙඳ පිරිවැටුම 1969 හා සැසැඳීමේදී රුපියල් දශලක්ෂ 57 කින් හෙවත් සියයට 13·7 කින් සංකෝචනය වීමට ප්‍රධාන හේතුව වූයේ මෙම කලාපයෙන් ගෙන්වන ලද ආනයනයන් පහළ වැටීමය. අනෙක් අතට, රුපියල් දශලක්ෂ 174 ක්ව පැවති අපනයන වටිනාකම 1969 ට වඩා රුපියල් දශලක්ෂ 9 කින් හෙවත් සියයට 5·5 කින් ඉහළ ගියේය. මේ අනුව,

වෙළෙඳ හිඟය රුපියල් දශලක්ෂ 11 ක් වූ අතර, මෙය, 1969 අවසානයේදී පැවති වෙළෙඳ හිඟයට වඩා රුපියල් දශලක්ෂ 75 කින් අඩුවිය. 1970 දී ලංකාවේ වෙළෙඳ පිරිවැටුම වූ රුපියල් දශලක්ෂ 359 හෙවත් සියයට 8·2, 1969 ට වඩා සියයට 3·8 කින් අඩුවිය.

සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව·හා නැගෙනහිර යුරෝපය සමඟ පැවති වෙළෙඳ කටයුතුවල භාණ්ඩ වර්ගීකරණයක් II (ඒ) 23 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1970 දී රුපියල් දශලක්ෂ 82·3 හෙවත් මුළු අපනයන වටිනාකමින් සියයට 47 ට හිමිකම් පාමින් සෝ. ස. ස. සංගමය මෙම කලාපයෙහි රටවල් අතුරින් ලංකාවේ ප්‍රමුඛ වෙළෙඳ හවුල්කරු විය. කෙසේ වුවද, 1969 දී සෝවියට් දේශය, මුළු අපනයන වටිනාකමින් සියයට 54 ක් ලබා ගත්තාය. ඉකුත් වසරේදී සෝවියට් සංගමයට අපනයනය කරන ලද භාණ්ඩයන්හි වටිනාකම හා සැසඳීමේදී මෙම වර්ෂයෙහි අනුරූපී අපනයන වටිනාකම රුපියල් දශලක්ෂ 7·2 කින් සංකෝචනය විය. මෙයට ප්‍රධාන හේතුන් වූයේ එරටට අපනයනය කරන ලද රබර් හා පොල් නිෂ්පාදිතයන් පහළ වැටීමය. කෙසේ වුවද, තේ අපනයන වටිනාකම ඉකුත් වසරට වඩා රුපියල් දශලක්ෂ 3·8 කින් ඉහළ ගියේය.

මෙම කලාපයෙහි ඊළඟ වැදගත් ගැනුම්කරුවා වූයේ පෝලන්තයයි. මෙම රටවල් කිහිපයට යවන ලද අපනයනයන්ගේ සියයට 23 ක් ඇය ලබා ගත්තාය. 1970 දී පෝලන්තයට යවනු ලැබූ අපනයනයන්ගේ වටිනාකම රුපියල් දශලක්ෂ 40·7 ක්වූ අතර 1969 අනුරූපී වටිනාකමට වඩා රුපියල් දශලක්ෂ 13·5 ක හෙවත් සියයට 50 ක පමණ ප්‍රසාරණයක් දක්විය. පසුගිය වසර කිහිපය තුළදී පෝලන්තයට යැවුනු ප්‍රධාන අපනයනයවූ රබර් හී වටිනාකම රුපියල් දශලක්ෂ 11·5 කින් හෙවත් සියයට 62·5 කින් සැලකිය යුතු අන්දමින් වැඩිවිය.

1970 දී ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට යැවුනු මුළු අපනයන්හී වටිනාකම රුපියල් දශලක්ෂ 6·0 කින් හෙවත් සියයට 44 කින් රුපියල් දශලක්ෂ 19·6 දක්වා වැඩිවිය. රුපියල් දශලක්ෂ 9·4 ක්ව පැවති පොල් තෙල් හි වටිනාකම 1969 අනුරූපී වටිනාකමට වඩා රුපියල් දශලක්ෂ 5·8 කින් හෙවත් සියයට 133 කින් තියුණු ලෙස ඉහළ ගියේය. 1970 දී ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට යවන ලද කපාපු පොල් පරිමාව හොණ්ඩර 21·7 දහසකින් අඩුවුවද, මෙම භාණ්ඩයෙහි සාමාන්‍ය නැ·වි ස. මිල රාත්තල රුපියල් 1·10 දක්වා (1969 දී පැවති රාත්තල රුපියල් 0·81 ක සාමාන්‍ය නැ. වි. ස. මිල හා සැසඳීමේදී) දෘශ්‍යමාන අන්දමින් ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් කපාපු පොල් අපනයන වටිනාකම වැඩිවිය.

1970 දී මෙම රටවලට යවන ලද මුළු අපනයනයන්ගෙන් සියයට 11 රුමේනියාව ලබා ගත්තාය. 1969 හා සැසඳීමේදී මුළු අපනයනයන්ගේ වටිනාකම රුපියල් දශලක්ෂ 19·0 හී නොවෙනස්ව පැවතුනි. රුමේනියාවට යැවුනු රබර් හී වටිනාකම රුපියල් දශලක්ෂ 16·9 ක්ව පැවති අතර සාමාන්‍ය නැ. වි. ස. මිල යහපත්වීමේ හේතුවෙන් මුළු වටිනාකම රුපියල් දශලක්ෂයකින් ප්‍රසාරණය විය.

1970 වර්ෂය තුළදී මෙම කලාපයෙන් ගෙන්වන ලද ආනයනයන්හි ප්‍රමුඛ සැපයුම් කරුවන් වූයේ පෝලන්තය, සෝ. ස. ස. සංගමය, යුගෝස්ලාවියාව සහ චෙකොස්ලෝවැකියාව යන රටවල්ය; මෙම රටවල් සැපයූ ආනයනයන්ගේ වටිනාකම රුපියල් දශලක්ෂ 185·3 වූ අතර කලාපයෙහි මුළු ආනයන වටිනාකමින් සියයට 80 විය.

1970 දී පෝලන්තයෙන් ගෙන්වනු ලැබූ ආනයනයන්හි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 48·4 ක්වූ අතර, 1969 දී මෙම කලාපයෙහි මුළු ආනයන වටිනාකමින් සියයට 9 හා සැසඳීමේදී මෙම වර්ෂයේදී අනුරූපී වටිනාකමින් සියයට 26 කට හිමිකම් කිය. 1970 දී පෝලන්තයෙන් ගෙන්වූ සීනි ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 28·7 කින් රුපියල් දශලක්ෂ 36·4 දක්වා වැඩිවිය. කෙසේ වුවද, රෙදිපිළි ආනයන රුපියල් දශලක්ෂ 4·1 කින් අඩු වූයේය. මෙම වර්ෂයේදී පෝලන්තය හා පැවති වෙළෙඳ හිඟය රුපියල් දශලක්ෂ 7·7 වූ අතර 1969 දී රුපියල් දශලක්ෂ 3·8 ක වෙළෙඳ අතිරික්තයක් පැවතිය.

1970 දී සෝ. ස. ස. සංගමයෙන් ගෙන්වන ලද ආනයනයන්හි වටිනාකම රුපියල් දශලක්ෂ 10·9 කින් රුපියල් දශලක්ෂ 39·8 දක්වා සංකෝචනය වූයේය. තේ පෙට්ටි ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 5·0 කින්ද සිමෙන්ති ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 2·6 කින්ද, සහ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 3.3 කින්ද අඩුවීමෙන් 1970 දී මුළු ආනයන වටිනාකම සංකෝචනයවීමට තුඩු දුන්හ. 1970 දී සෝ. ස. ස. සමඟ පැවති වෙළෙඳ ශේෂය රුපියල් දශලක්ෂ 42·5 ක අතිරික්තයක් දක්වූ අතර 1969 දී වෙළෙඳ අතිරික්තය රුපියල් දශලක්ෂ 38·8 ක් විය.

යුගෝස්ලාවියාවෙන් 1970 දී ගෙන්වූ ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 20. 5 කින් රුපියල් දශලක්ෂ 30·5 දක්වා අඩු වූයේය. II (ඒ) 23 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇති පරිදි රුපියල් දශලක්ෂ 27·0 ක්ව පැවති සීනි ආනයනයන්ගේ වටිනාකම 1969 අනුරූපී වටිනාකම හා සැසඳීමේදී රුපියල් දශලක්ෂ 18·5 කින් හෙවත් සියයට 41 කින් අඩුවූ අතර විමර්ශනයට භාජනය වන වසර තුළදී ආනයනය කළ යන්ත්‍ර සූත්‍ර වටිනාකමද සංකෝචනය විය. 1970 දී යුගෝස්ලාවියාව හා පැවති වෙළෙඳ ශේෂය රුපියල් දශලක්ෂ 26·1 හිඟයක් දක්වූයේය.

1970 දී චෙකෝස්ලෝවැකියානු ආනයන වටිනාකම ඉකුත් වසරෙහි රුපියල් දශලක්ෂ 13·3 සිට රුපියල් දශලක්ෂ 17·1 න් රුපියල් දශලක්ෂ 30·4 දක්වා දෘශ්‍යමාන අන්දමින් ඉහළයාමට බොහෝසේ හේතු වූයේ සීනි ආනයනයන් වැඩිවීමය. 1970 දී චෙකොස්ලෝවාකියාව සමඟ පැවති වෙළෙඳ ශේෂය රුපියල් දශලක්ෂ 26·9 ක හිඟයක් පල කළ අතර 1969 දී රුපියල් දශලක්ෂ 9·7 ක වෙළෙඳ හිඟයක් පැවතුණි.

මෙම කලාපයෙන් ගෙන්වන ලද සීනි ආනයනයන්හී මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 109·1 වූ අතර, මෙරටට ආනයනය කළ මුළු සීනි ආනයනය වටිනාකමින් සියයට 64 විය. තවද, මෙම රටවලින් ගෙන්වූ සිමෙන්ති ආනයන වටිනාකම මුළු සිමෙන්ති ආනයන වටිනාකමින් සියයට 40 විය.

**ද්විපාර්ශ්වීය නිශ්කාෂණ ගිණුම්**

මහජන චීන සමූහාණ්ඩුව, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය, නැගෙනහිර යුරෝපීය සහ මැද පෙරදිග රටවල් කිහිපයක් සමඟ ලංකාව ඇති කර ගන්නා ලද ගෙවීම් ගිවිසුම්වලට අනුව සැකසුනු ද්විපාර්ශ්වීය නිශ්කාෂණය ගිණුම්හී කාර්තු අනුව මුළු ශුද්ධ තත්ත්වය II (ඒ) 24 වැනි සටහන මගින් දක්වා ඇත.

1970 අවසානයේදී ලංකාවෙන් අයවිය යුතුවූ මුදල් ප්‍රමාණය, 1969 අවසානය හා සැසඳීමේදී, රුපියල් දශලක්ෂ 99·4 කින් අඩුවූ බව II (ඒ) 24 වැනි සංඛ්‍යා සටහනින් විද්‍යමානවේ.

**සෝ. ස. ස. සං සහ නැගෙනහිර යුරෝපය**

| | බල්ගේරියාව | | චෙකොස් ලෝවේකියාව | | ජ. ප්‍ර. සමූහාණ්ඩුව | |
|---|---|---|---|---|---|---|
| | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 |
| (I) මුළු අපනයන .. .. | **1·99** | **2·09** | **3·60** | **3·49** | **13·61** | **19·63** |
| අතුරින් | | | | | | |
| තේ .. .. .. | — | 0·93 | ... | 0·23 | 0·14 | 0·09 |
| රබර් .. .. | 1·34 | 1·11 | 1·16 | 0·36 | — | — |
| ප්‍රධාන පොල් නිෂ්පාදන ත්‍රය .. | — | — | 1·09 | 2·25 | 12·38 | 18·01 |
| (II) මුළු ආනයන .. .. | **1·06** | **0·54** | **13·34** | **30·41** | **84·62** | **10·01** |
| එයින් | | | | | | |
| සීනි .. .. .. | — | — | 3·68 | 20·84 | 12·89 | — |
| යන්ත්‍රසූත්‍ර .. .. | 0·05 | 0·01 | 3·44 | 2·37 | 40·89 | 8·63 |
| රෙදිපිළි .. .. | 0·47 | 0·49 | 3·61 | 5·82 | 0·09 | — |
| තේ පෙට්ටි .. .. | — | — | — | — | — | — |
| යකඩ සහ වානේ .. .. | — | — | 0·43 | 0·19 | 0·75 | 0·14 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත .. .. | — | — | — | — | — | ... |
| සිමෙන්ති .. .. | — | — | — | — | — | — |
| වෙළඳ ශේෂය (I) — (II) .. .. | + 0·93 | + 1·55 | − 9·74 | −26·92 | −71·01 | + 9·62 |

## II (ඒ) 23 වැනි සංඛ්‍යා සටහන

**සමඟ කළ වෙළෙඳමේ අගය (භාණ්ඩ අනුව)**

රුපියල් දශ ලක්ෂ

| හංගේරියාව | | පෝලන්තය | | රුමේනියාව | | යුගෝස්ලෝවියාව | | සෝ. ස ස. සං. | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 | 1969 | 1970 |
| **1·37** | **2·03** | **27·21** | **40·65** | **19·70** | **19·04** | **7·37** | **4·41** | **89·49** | **82·33** | **164·34** | **173·67** |
| 0·21 | 0·19 | 6·83 | 7·25 | ... | — | 0·08 | 0·17 | 14·42 | 18·20 | 21·68 | 27·06 |
| — | 0·50 | 18·35 | 29·91 | 15·90 | 16·89 | 1·34 | 0·49 | 35·32 | 28·48 | 73·41 | 77·74 |
| 1·16 | 1·33 | 0·99 | 2·85 | 1·99 | 2·15 | 4·20 | 1·75 | 36·19 | 27·36 | 58·00 | 56·21 |
| **11·38** | **7·59** | **23·42** | **48·35** | **15·05** | **18·11** | **51·00** | **30·47** | **50·70** | **39·79** | **250·57** | **185·27** |
| 1·16 | — | 7·68 | 36·37 | 5·52 | 6·75 | 45·53 | 26·95 | 18·57 | 18·17 | 95·03 | 109·08 |
| 0·13 | 0·23 | 0·52 | 0·19 | 1·72 | 2·36 | 2·84 | 0·39 | 0·73 | 3·20 | 50·32 | 17·88 |
| 0·86 | 5·52 | 10·92 | 6·81 | 0·53 | 1·66 | — | — | 3·44 | 3·94 | 19·92 | 24·24 |
| — | — | — | — | — | — | — | — | 11·62 | 6·59 | 11·62 | 6·59 |
| ... | ... | 1·30 | 1·27 | — | 2·83 | 0·43 | 1·22 | 0·81 | 1·32 | 3·72 | 6·97 |
| — | — | — | — | 3·14 | — | — | ... | 3·25 | ... | 6·39 | ... |
| — | ... | — | — | — | — | — | — | 5·47 | 2·91 | 5·47 | 2·91 |
| -10·01 | - 5·56 | + 3·79 | - 7·70 | +4·65 | + 0·93 | -43·63 | -26·06 | +38·79 | +42·54 | -86·23 | -11·60 |

මූලය: ලංකා රේගු වාර්තා

## II (ඒ) 24 සංඛ්‍යා සටහන

## ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම්

## 1969 - 70 ගිණුම්වල මුළු ශුද්ධ තත්ත්වය කාර්තු වශයෙන්

රුපියල් දශ ලක්ෂ

| අවසානයෙහිදී පැවති ශුද්ධ තත්ත්වය | | චීනය, සෝ.ස.ස. සංගමය සහ අනිකුත් නැගෙනහිර යුරෝපීය රටවල්* | | මැද පෙරදිග රටවල්** | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | හර | බැර | හර | බැර | හර | බැර |
| 1969 | මාර්තු .. .. | 175·7 | — | — | 9·7 | 166·0 | — |
| | ජූනි .. .. | 130·5 | — | — | 10·3 | 120·2 | — |
| | සැප්තැම්බර් .. .. | 134·5 | — | — | 6·1 | 128·4 | — |
| | දෙසැම්බර් .. .. | 169·4 | — | — | 4·5 | 164·9 | — |
| 1970 | මාර්තු .. .. | 198·6 | — | — | 10·3 | 188·3 | — |
| | ජූනි .. .. | 156·1 | — | — | 9·2 | 146·9 | — |
| | සැප්තැම්බර් .. .. | 86·7 | — | — | 9·2 | 77·5 | — |
| | දෙසැම්බර් .. .. | 74·3 | — | — | 8·8 | 65·5 | — |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* බල්ගේරියා, චෙකොස්ලෝවැකියා, ජ. ප්‍ර. ස, හංගේරියාව, පෝලන්තය, රුමේනියාව, යුගෝස්ලෝවියා සහ මහජන කොරියානු සමූහාණ්ඩුව.

** සිරියා.

හර: ලංකාවෙන් අය විය යුතුය.

බැර: ලංකාවට අය විය යුතුය.

### (ඊ) වාණිජ ප්‍රතිපත්තියෙහි වර්ධනයන්

### ආනයන පාලනය

1970 පෙබරවාරි 24 වැනිද සිට නැවගත කරන්නන්ගේ ගබඩාවන් වෙත සැපයුනු මෙට්ට කොහු හොණ්ඩරයක අවම මිල රුපියල් 13·50 දක්වා වැඩි කළ අතර, මෙට්ට කොහු හැර අනිකුත් සියළුම වර්ගයේ කොහු වෙනුවෙන් රුපියල් 32·00 මිලක් නියම විය (ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය: 1970 පෙබරවාරි 24 වැනි දින නො:14,894/4).

### ආනයන පාලනය

1968 මැයි මාසයේදී ක්‍රියාත්මකවූ ආනයන පාලන නිර්දේශයන් 1970 අගෝස්තු මස 4 වැනිද දක්වා ක්‍රියාත්මක විය. මෙදින සිට විවෘත පොදු බලපත් ක්‍රමය අහෝසිවූ අතර ඒ දක්වා විවෘත පොදු බලපත්‍ර යටතේ ආනයනය කළ භාණ්ඩ සියල්ලම වෙළෙඳ සලාක ක්‍රමයක්[1] යටතට පත් කරනු ලැබීය. කෙසේ වුවද, එවැනි ආනයනයන් වෙනුවෙන් විදේශීය විනිමය හිමිකම් සහතික පත් ඉදිරිපත් කළ යුතු විය. වි. පො. බ. ක්‍රමය අහෝසි කිරීමේ මුල් පියවරක් වශයෙන් 1970 මැයි මස 29 වැනිද සිට විදේශීය විනිමය හිමිකම් සහතික පත් විකිණීම් අත්හිටවනු ලැබුවද කල්පිරුණු ආනයන බිල්පත් විසුම් ගැන්වීමේදී හෝ විනිමය පාලක විසින් නිකුත් කරන ලද බලපත්‍ර අනුව විදේශීය විනිමය පිටරට යැවීමේදී හෝ විවිහිස අවශ්‍ය විය.

සම්මත හා ලියාපදිංචිවූ කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවයන් නියම පරිහරණය බලපත්‍ර යටතේ කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය මගින් තවදුරටත් නිකුත් කරනු ලැබීය.

1. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය: 1973 අගෝස්තු 4 වැනිද; නො 14,917/2.

**( උ) විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය**

1968 මැයි මාසයේදී ආරම්භ කරනු ලැබූ විදේශීය විනිමය හිමිකම් සහතිකපත් ක්‍රමය 1970 දීද ක්‍රියාත්මක විය. රුපියල් 100 ක මතුපිට වටිනාකමක් ඇති විදේශීය විනිමය හිමිකම් සහතික පතක මිල රුපියල් 55 හී තවදුරටත් පැවතුනි.

1970-71 මුදල් වර්ෂයේ අයවැය කථාවෙහි දැක්වූ පරිදි පොත්පත් හා සඟරා, රෝද දෙකේ ට්‍රැක්ටර් සහ ඒවායේ අමතර කොටස්, කපු නූල් සහ අමු පුළුන් යනාදී ආනයනයන් 'අ' වර්ගය යටතට පත් කළ අතර විවිගිස සහතිකපත් වලින් මෙම ආනයනයන් මුදලීය. මේ අතර, සීනි සහ ඉරිඟු ආනයන ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය, ලංකා ගමනාගමන මණ්ඩලය සහ ලංකා විදුලි බල මණ්ඩලය යනාදියෙහි ආනයන 'අ' වර්ගය යටතට පත් කොට ඒ සම්බන්ධයෙන් විවිහි සහතික පත් ඉදිරිපත් කිරීමට නියම කළහ.

**(ඌ) තීරු බදු**

**අපනයන බදු**

1970 10. 25[1]

මිනිරන් වෙනුවෙන් පැවති අපනයන බද්ද නියම නෑ. වී. ස. වටිනාකමින් (කොළඹ) සියයට 50 දක්වා, සියයට 25 කින් වැඩි කෙරුණි.

**ආනයන බදු**

1970. 10. 26[2]

ආනයන බදු ව්‍යුහය ක්‍රමවත් කිරීමේ සහ ලිහිල් කිරීමේ පියවරක් වශයෙන් 1970 ඔක්තෝබර් මස 26 වැනිද සිට එතෙක් පැවති ආනයන බදු සංශෝධනය කර, පහසුවෙන් හඳුනාගත හැකිබදු අනුපාතික සීමාවන් කිහිපයකට නැවත කොටස් කරනු ලැබීය. මෙම නව වර්ගීකරණයෙන් බලාපොරොත්තු වූයේ, සංවර්ධනයට ඇවැසි අමු ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යාවශ්‍යඅන්තර් සහ ආයෝජන භාණ්ඩ අඩු බදු අනුපාතිකයන් අනුව ආනයනය කිරීමට ඉඩ සලසා එමගින් ආර්ථික සංවර්ධනය ඇති කිරීමය. තවද මෙ මගින් දේශීය කර්මාන්ත සහ කෘෂිකර්මාන්තයට යෝග්‍ය ආවරණයක් ලබාදී ආනයන ආදේශනය වඩා යුහුසුළුව කිරීමේ අදහසක්ද පැවතුනි.

නව තීරු බදු ක්‍රමය මගින් අනුපාතික සීමාවන් හයකට ආනයන බදු වර්ග කරනු ලැබීය. ජීවන වියදමට යටත් වන්නාවූ මූලික පාරිභෝජන භාණ්ඩ වෙනුවෙන් තීරු බදු නියම නොවූ අතර කෘෂිකර්මාන්තයට සහ කර්මාන්තයට අවශ්‍යවූ යන්ත්‍ර සූත්‍ර සහ මූලික කාර්මික අමු ද්‍රව්‍ය වෙනුවෙන් නාමික බදු අනුපාතිකයන් නියම විය. සාමාන්‍ය බදු අනුපාතිකය සියයට 60 හී පිහිටීය. මෙයට ඉහළ මට්ටමේ තීරු බදු අනුපාතිකයන් නියම කරනු ලැබුවේ දේශීය නිෂ්පාදනයට ආවරණයක් ලබාදීමට සහ නොයෙකුත් භාණ්ඩ දේශීය වශයෙන් නිමැයීමට මෙන්ම අනාගත සංවර්ධනයට හිතකර නව නිෂ්පාදන මාර්ගයන් වෙත උනන්දුවක් ඇති කිරීමටය. ඉහළ මට්ටමේ බදු අනුපාතිකයන් නියම වූයේ, මුළුමනින්ම වාගේ, අත්‍යාවශ්‍ය නොවූ සහ සුඛෝපභෝගී භාණ්ඩ වෙනුවෙනි.

**(එ) වෙළෙඳ ගිවිසුම්[3]**

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී පහත සඳහන් රටවල් හා සමග ලංකාව, වෙළෙඳ ගිවිසුම් ඇති කර ගත්තාය.

1. එක්සත් අරාබි ජනරජය: 1970 පෙබරවාරි 14 වැනි දින.
2. ප්‍රජාතන්ත්‍රවාදි මහජන කොරියානු සමූහාණ්ඩුව: 1970 සැප්තැම්බර් 21 දින,
3. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය: 1970 නොවැම්බර් 2 දින.
4. පකිස්ථානය: 1970 නොවැම්බර් 19 වැනි දින.
5. බල්ගේරියානු මහජන සමූහාණ්ඩුව: 1970 නොවැම්බර් 27 වැනි දින.

---

1. ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය; නො. 14,929/3, 1970 ඔක්තෝබර් 25 වැනිදා.
2. ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය; නො. 14,929/5 1970 ඔක්තෝබර් 26 වැනිදා.
3. මෙම කොටසෙහි සඳහන් වී ඇති වෙළෙඳ ගිවිසුම්වලට අතිරේකව වෙනත් රටවල් කිහිපයක් හා සමග ලංකාව වෙළෙඳ ගිවිසුම් ඇති කර ගෙන තිබුණි.